# විදුලි බිල වැඩි නම් අඩු කරගන්න
P 10

THE CHATHAM STREET JOURNAL
Trust your source. Trust your decisions. https://csj.lk/ 2023|02|19 Vol: 25



# එන්න අපි පාරට බහිමු
P 04



## හරිනි, ඔයාට දැන් කොහොමද? තාමත් ඒ විදියද?
P 09

## බඩගින්න නොදන්න රටක් බිහිකිරීමේ අභියෝගය
P 06



## මේ 2019 නොවේ බංකොලොත් 2023
P 03

## களையிழந்து போன குட்டித் தேர்தல்! ஜனநாயகம் எங்கே?
P 12

## Get ready for slow economic recovery amidst LG polls
P 11



## රටට ගොඩයන්න නොදෙන වැඩවර්ජන
P 02

## රාජ්‍ය සේවය සුද්ද කරන පෙරළියක්
P 08



## දම් පාට නරියන්ට SORRY!
P 07




# රටට ගොඩයන්න නොදෙන වැඩවර්ජන

මාර්තු මස 1 වනදා ඒකාබද්ධ සමස්ත මහා වැඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කිරීමට වෘත්තීය සමිති තීරණය කර තිබේ. ඒ අනුව තෙල්, විදුලි, වරාය, ජල සම්පාදන, සෞඛ්‍ය, අධ්‍යාපන, බැංකු පද්ධතිය ඇතුළු ක්ෂේත්‍ර රැසක වෘත්තීය සමිති ඒකාබද්ධව මෙම වැඩවර්ජනය සිදු කිරිමට එහිදී වෘත්තීය සමිති නියෝජිතයින් තීරණය කර තිබේ. දැන් මේ වෘත්තීය සමිති විසින් වැඩවර්ජනයක් කැඳවා ඇත්තේ තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් දිනාගන්න එහෙම නොවේ. තමන් පක්ෂපාතීත්වය දරණ දේශපාලනික වුවමණාවක් ජයග්‍රහණය කරවීම වෙනුවෙන් මේ වන විට රටේ පවතින අර්බුදය යොදාගැනීම මිස වෙනකක් නොවන බව පැහැදිලි කරුණකි.

රට මුහුණ දෙන අර්බුද හමුවේ අරයට මෙයාට කියා වෙනසක් නැතිව සමස්ත සමාජයම පීඩාවට පත්ව සිටින බවත් අමුතුවෙන් කිවයුතු නැත. ඒ අප අත්දකින දෙයය. රටට මෙහෙම සිද්ධ වුණේ කවුරු නිසාද යන්න ගැනත් සමාජයට යම් අදහසක් තිබේ. නමුත් ඒ වගකීමෙහි වැඩි බරක් යොදා ඇත්තේ රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ දේශපාලකයන්ගේ ගිණුමටය. හැමදාම සිදු වුණේ එයය. නමුත් රටක් බංකොළොත් කිරීම දේශපාලකයාට තනිවම කළ හැකි හපන්කමක් නොවේ. මේ සඳහා රාජ්‍ය නිලධාරී තන්ත්‍රයේ දායකත්වයත්, පුරවැසි ජනතාවගේ දායකත්වයත් අවශ්‍යය. මේ අනුව දෙතුන් ගොල්ලොම රට බංකොළොත් කිරීමේ වගකීම බාරගත යුතුව ඇත.

ශ්‍රී ලංකා ජනරජය කියන්නේ ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරන ඒ මඟින් විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය කියන ආයතන තුනට බලය පවරා ඇති ආණ්ඩු ක්‍රමයක් සහිත රටකි. මේ බලය පැවරීම කරන්නේ ජනතාව විසින්ය. ඒ අනුව රට අද පත්ව තිබෙන තැනට ඇද දැමීම ගැන සංකල්පීයව මූලිකම වගකීම පැවරෙන්නේ කිසිදු වර්ග කිරීමකින් තොරවම සමස්ත ජනතාවටය. මේ ජනතා පරමාධිපත්‍ය යටතේ ක්‍රියාත්මක වූ රට නිදහසෙන් ගෙවුණු වසර 75කට පසු තවදුරටත් එහෙම පවතින්නට නොහැකි වන තැනට පත්ව ඇත. රට බංකොළොත්ය. පාලකයනුත් ජනතාවත් කරකියාගන්න දෙයක් නැතිව සිටී.

රාජ්‍ය වෘත්තීය සමිති විසින් දැන් වැඩවර්ජනය කරන්නේ මේ තත්වය තුළය. ඔවුන් තමන් වෙනුවෙන් ඉල්ලීම් රැසක් කරමින් තිබේ. ඔවුන්ට අනුව රටට හෙණ ගහල ගියත් මේ ඉල්ලීම් දිය යුතුය. නැතිනම් වැඩවර්ජනය කර රට තවදුරටත් ආගාධයටම හෙළන බවට තර්ජනය කරයි. දැන් මේ අය ඉල්ලන කිසිදු ඉල්ලීමක් රාජ්‍යයට දිය හැකිද යන්න වර්තමානයේ පවතින ගැටලුවය. මේ අයත් හොඳටම දන්නවා රජයට මේ පටු ඉල්ලීම් දිය නොහැකි බව. මේ මොහොතේ රට මුහුණ දෙන මූල්‍ය අර්බුදය ගැන, තමන් රාජකාරී කරන ආයතනය පත්ව තිබෙන අසීරුතාවයන් ගැන හොඳාකරවම දනී. මේ ආයතන ලාබ ලබමින් රාජ්‍යයට ආදායම් සොයා දෙනවාද? නැතිනම් පාඩු ලබමින් මහා භාණ්ඩාගාරයෙන් පාඩු පියවමින් පවත්වාගෙන යනවාද? කියා මේ අය හොඳින් දනී. ඒ සියල්ලටම වඩා ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් තමන් දැක්වූ දායකත්වයේ තරම ගැන මේ අය ඉතා හොඳින් දන්නවාට සැක නැත. තම ආයතය දිගින් දිගටම පාඩු ලබමින් තිබුණත් තමන්ගේ වැටුප්, දීමනා, බෝනස් ආදිය සතයකින් අඩු නොකර ලබා ගෙන ද තිබේ. වාර්ෂික වැටුප් වැඩිවීම් නියමාකාරයෙන් ලබා ගෙන තිබේ. වසරකට මාස 12ක් වුවාට මාස 21ක වැටුප් වාර්ෂිකව ලබා ගත් අයද සිටී. ලක්ෂ දෙක තුන නැති නම් දහය පහළොව වැටුප් වාර්තා තියෙන මෙම පිරිස් රජය වැටුපෙන් බදු අය කර ගන්නවාටත් මුළුමනින්ම විරුද්ධය.

දැන් වැඩවර්ජනයට එළඹ තමන්ගේ ඉල්ලීම් ලබාදෙන ලෙස කියන්නේ මෙම පිරිස මූලික කර ගත් අන්තේවාසිකයන්ය. මේ අය හිතන්නේ තම තමන්ගේ පවුලේ උදවිය පමණක් ජීවත් වුණොත් ඇතිය කියන එකය. මේ කණ්ඩායම සමස්තයක් ලෙස ගතහොත් ලක්ෂයකටත් වඩා අඩු පිරිසකි. මන්ද රුපියල් ලක්ෂයකට වඩා වැටුප් ගන්නා පිරිස මේ රටේ සිටින්නේ 125,000කට ආසන්නවය. ඒ අනුව මෙම වැඩවර්ජනයට එක්ව සිටින්නේ එයිනුත් කොටසකි. රට ගැන ජනතාව ගැන මැදිහත්ව කල්පනා කර මේ මොහොතේ රට ගොඩගන්න තමන්ගෙනුත් දායකත්වයක් තිබිය යුතුය කියා කල්පනා කර රටේ අනෙකුත් ජනතාව සමඟ පීඩාවන් සමව දරාගෙන රජයට සහයෝගයක් ලබාදෙන රටට හිතැති විශාල පිරිසක් ද ඉහළ වැටුප් තලවල සිටිති. එම අය මේ වැඩවර්ජනයට සහය නොදෙති. නමුත් එම පිරිසට හෝ වෘත්තීය සමිතිකාරයන් වැඩකරන්න දෙන්නේ නැත. සාමාන්‍යයෙන් වෘත්තීය ක්‍රියාමාර්ගයක් ගන්නා විට ඊට අකමැති පිරිස්වලට මේ අයගේ තර්ජනයට ගර්ජනයට නැතිනම් පහර කෑමට සිදුවීම සාමාන්‍ය දෙයකි. ඒ නිසා කැමැති වුණත් අකමැති වුණත් වෘත්තීය ක්‍රියාමාර්යක් දියත් වන විට නිහඬව නිශ්ක්‍රීයව සිටීමට පිරිසකට සිදුවෙයි. නමුත් වෘත්තීය සමිතිකාරයන් ගණන් හදන්නේ සමස්ත සේවකයන්ම තමන්ගේ සටනට එකතු

**කොහොම නමුත් මේ වෘත්තීය සමිතිකාරයන් කියන්නේ දේශපාලන පක්ෂවල අතකොලුය. නැතිනම් එම පක්ෂ පෝෂණය කරන මූල්‍ය ප්‍රවාහය ය. මේ නිසා ඒ ඒ පක්ෂවල අනුග්‍රහය ආශිර්වාදය මේ වෘත්තීය සමිතිකාරයන්ට තිබේ. වෘත්තීය සමිතිවල බලය ගොඩනැගීමට පෙරළා එම පක්ෂවල සම්බන්ධයත් අවශ්‍යය. දෙගොල්ල රැකෙන්නේ දෙගොල්ලන්ගේ සහයෝගය, අවබෝධය මතය. මේ නිසා මෙම වැඩවර්ජනය, පටු ඉල්ලීම් දිනා ගැනීමේ සටන් පාඨවලින් ඔබ්බට ගොස් මේ මොහොතේ විපක්ෂ පක්ෂවල තිබෙන බලලෝබී වුවමණාවන් සන්තර්පණය කිරීම වෙනුවෙන්ම ක්‍රියාත්මක වන්නකි. රට අවුලෙන් අවුලට පත් කොළොත් ඒ හරහා ජනතාව රවටා තමන්ට බලය අත්පත් කරගැනීමේ පහසු හැකියාවක් ඇති බව මේ පක්ෂ කල්පනා කරයි. දැන් බළලුන් ලවා කොස් ඇට බාවනවා සේ මේ වෘත්තීය සමිති ඒ වෙනුවෙන් යොදාගැනීම සිදු කරයි. මේ අනුව ඉතා පැහැදිලිවම, වැඩවර්ජන ක්‍රියාදාමය කියන්නේම රටට කෙළවීමය.**

වූ බව කියමිනි. ඉදිරි වැඩවර්ජනය ගැන ගණන් හැදෙන්නේ එහෙමය. එවිට රටට යන පණිවිඩය විකෘතියකි. නමුත් ඇත්ත ඉතා සුළුතරයකගේ පටු දේශපාලනික වුවමණාවක් මත මේ වර්ජනයන් සිදුවීමය. මේ නිසා රජය වුව මේවා ගණන් ගන්නේ නැත.

කොහොම නමුත් මේ වෘත්තීය සමිතිකාරයන් කියන්නේ දේශපාලන පක්ෂවල අතකොලුය. නැතිනම් එම පක්ෂ පෝෂණය කරන මූල්‍ය ප්‍රවාහය ය. මේ නිසා ඒ ඒ පක්ෂවල අනුග්‍රහය ආශිර්වාදය මේ වෘත්තීය සමිතිකාරයන්ට තිබේ. වෘත්තීය සමිතිවල බලය ගොඩනැගීමට පෙරළා එම පක්ෂවල සම්බන්ධයත් අවශ්‍යය. දෙගොල්ල රැකෙන්නේ දෙගොල්ලන්ගේ සහයෝගය, අවබෝධය මතය. මේ නිසා මෙම වැඩවර්ජනය, පටු ඉල්ලීම් දිනාගැනීමේ සටන් පාඨවලින් ඔබ්බට ගොස් මේ මොහොතේ විපක්ෂ පක්ෂවල තිබෙන බලලෝබී වුවමණාවන් සන්තර්පණය කිරීම වෙනුවෙන්ම ක්‍රියාත්මක වන්නකි. රට අවුලෙන් අවුලට පත් කොලොත් ඒ හරහා ජනතාව රවටා තමන්ට බලය අත්පත් කරගැනීමේ පහසු හැකියාවක් ඇති බව මේ පක්ෂ කල්පනා කරයි. දැන් බළලුන් ලවා කොස් ඇට බාවනවා සේ මේ වෘත්තීය සමිති ඒ වෙනුවෙන් යොදාගැනීම සිදු කරයි. මේ අනුව ඉතා පැහැදිලිවම, වැඩවර්ජන ක්‍රියාදාමය කියන්නේම රටට කෙළවීමය.

අද රටට අවශ්‍යව තිබෙන්නේ වැඩවර්ජන නොවේ. වැඩි වැඩියෙන් වැඩ කිරීමය. රට ගොඩදැමීමේ වුවමණාවය. රට වෙනුවෙන් කැපකිරීම් කිරීමය. පාලකයෝ හොරුන්ය දූෂිතයන්ය, ඒ නිසා රජයට සහයෝගය දෙන්න බැරිය යන්න මේ අයගේ ජනප්‍රිය සටන් පාඨයකි. නමුත් එය අර්ධ සත්‍යයකි, අතිශයෝක්තියකට නැංවීමකි. මේ කරන විවේචනය මේ අයට රෙද්දක් ඇඳගෙන ඇත්තටම කරන්න බැරිය. මන්ද පාලකයා මෙන්ම මේ රාජ්‍ය නිලධාරී තන්ත්‍රයත් රටට කර තිබෙන හානිය ඉතා බරපතලය. සියළුම දෙනා ඊට අයත් නැති වුණත් සාතිශය බහුතරය එසේය. රාජ්‍ය ආයතන පාඩු පිට පාඩු ලබන්නේ මේ රාජ්‍ය නිලධාරීන්ගේ කෙරුම්කාරකම් නිසා මිසක පාලකයන්ගේ වැඩ නිසාම නොවෙයි. දේශපාලනඥයන් කවර ජඩ වැඩ කළත් ආයතනය සුරක්ෂිත කරගැනීම, ඒවා ඵලදායක, කාර්යක්ෂම ආයතන බවට පත් කරමින්, ලාබ ලැබීම කෙසේ වෙතත් පාඩු නොවන සේ පවත්වාගෙන යෑම ගැන වගකීම ඇත්තේ රාජ්‍ය නිලධාරීන්ටය. අඩුම තරමින් ආයතනයක් ගොඩදැමීම වෙනුවෙන් මේ වෘත්තීය සමිතිකාරයන් ශ්‍රමදානයක්වත් කර තිබෙන බවක් වාර්ථා වෙන්නේ නැත. මෑත භාගයේ වෘත්තීය සමිතිවලට ඇත්තේ තමන්ගේ බඩගෝස්තරය වෙනුවෙන් වන මලපෙරේත අජූව සටන් ඉතිහාසයකි. දේශපාලකයා වෙතින් වැරැද්දක් වන්නේ තමන්ට බලය තිබෙන මොහොතකදී පමණය නමුත් මේ දූෂිත රාජ්‍ය නිලධාරී තන්ත්‍රය දශක ගණනාවක් තිස්සේ එක දිගට දූෂිත ක්‍රියාදාමයක නියැලෙයි. අකාර්යක්ෂම භාවිතයක නියැලෙයි. බහුතරයක තත්වය එසේය. ඒ අනුව දේශපාලකයාට වඩා රටට හානි කර ඇත්තේ මේ දූෂිත රාජ්‍ය නිලධාරී තන්ත්‍රය බව ගණන් හදා පෙන්විය හැක. කැඳවා තිබෙන වැඩවර්ජනයේ තේරුමත් මේ දූෂිත අකාර්යක්ෂම ක්‍රමය රැකගෙන මජර දේශපාලනයම නඩත්තු කරන පටු අවස්ථාවාදී තකක්ඩි වැඩ වර්ජනයක් බවය.




ප්‍රභාත් ජයසුමන

# මේ 2019ය නොවේ, බංකොලොත් 2023යි



පළාත් පාලන මැතිවරණය කල් දැමීමක් ගැන දේශපාලන ක්ෂේත්‍රය උණුසුම් වී තිබුණට ඒ ගැන ජනතාවට නම් වගේ වගක් නැත. මන්ද මේ තමන්ට අමුතු යහපතක් නොවෙන මැතිවරණයකට වඩා විසඳා ගැනීමට බරපතල ප්‍රශ්න ජනතාව හමුවේ ඇති නිසාය. මේ ගැටලු ගැන කතා කිරීම, ඒ සඳහා විසඳුම් යෝජනා කිරීම හෝ ජනතාවට සහනයක් සැලසීම ගැන වගේ වගක් නැති විපක්ෂය මැතිවරණයක් පස්සේ දුවන්න ගැනීම ගැන ජනතාව ඉන්නේ ද කැමැත්තකින් නොවේ. ජනතාව බලාගෙන ඉන්නේ ආණ්ඩුවෙන් යම් හෝ පිළිසරණක් ගමන්ට ලැබෙන තුරුය. රට මේ වන විට මුහුණ දී ඇති අර්බුදයන් හමුවේ ආණ්ඩුව ද බරපතල අර්බුදයකට මුහුණ දී සිටින බවත් ජනතාවට රහසක් නොවේ. එමෙන්ම මෙහෙම හරි ඔලුව උස්සගෙන ඉන්න පුළුවන්කමක් ලැබුණේ රනිල් වික්‍රමසිංහ පාලනය නිසා බවද ජනතාවට අවබෝධයක් තිබේ. මීට මාස 6කට පෙර තිබූ තත්වයන් අඛණ්ඩව ඉදිරියට ගියේ නම් මෙය විසාලා මහනුවර අභග්‍යයට දෙවෙනි වන්නේ නැත. නමුත් ඒ අනතුරෙන් අද රට මුදවා තිබේ. ජනාධිපතිවරයා රට භාර ගැනීමේදී දුන් පොරොන්දු එකින් එක ඉටු කරමින් තිබේ. මේ 2023 වසර වඩාත් දුෂ්කර වනු ඇති බවත් ඔහු වෙලාසන කියා තිබිණි. නමුත් හිතපු තරම් දුෂ්කරතාවයක් ඇති නොවුණත් මේ වසර තුළ තවදුරටත් ජය ගත යුතු අභියෝග රැසක් ඉතිරිව ඇත. ඒ ජය ගන්න නම් ඒ කාලය ජනාධිපතිවරයාට දිය යුතුය. එහෙම කියන්නේ මේ කිසිදු අර්බුදයක් ජය ගන්නට ජනාධිපතිවරයා ඉදිරිපත් කරන විසඳුම්වලට වඩා සාධනීය හෝ විකල්ප මතයක් විපක්ෂය වෙතින් ඉදිරිපත්ව නොමැති නිසාය. සියළුදෙනා විසඳුම් ලෙස ඉදිරිපත් කරන්නේ ජනාධිපතිවරයා දැනටත් ක්‍රියාත්මක කර ඇති දේය.

කොහොම නමුත් මේ සතිය වන විට මැතිවරණය පැවැත්වීමට වඩා නොපැවැත්වීමේ සම්භාවිතාව ඉහළ ගොස් ඇත. මුලිකම ගැටලුව රට මුහුණ දී ඇති මුල්‍ය අර්බුදය හමුවේ මේ මෙහොතේ අත්‍යවශ්‍ය නොවන මැතිවරණයක් වෙනුවෙන් වැය කරන්න තරම් මුදලක් රජය සතුව නොවීමය. මුද්‍රණාලයාධිපතිනිය මැතිවරණ පත්‍රිකා මුද්‍රණය කිරීමට අදාල පිරිවැය ලබා ගැනීම ගැන, මැතිවරණ කොමිසමෙන් විමසා තිබිණි. ඒ සම්පූර්ණ ගාස්තුව ගැනවත් නොවේ, අත්තිකාරම් මුදලක් ගැනය. නමුත් ඊට දෙන්න පිළිතුරක් කොමිසම සතුව නොතිබීම මත එම මුද්‍රණ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. දැන් ප්‍රශ්නය තිබෙන්නේ කොමිසමට මැතිවරණය වෙනුවෙන් වැය වෙතැයි අපේක්ෂා කරන රුපියල් බිලියන දහය හෝ දොළහා කෙසේ වෙතත් එදිනෙදා වැඩ කටයුතු කරගැනීමට අවශ්‍ය මුදල් ප්‍රමාණයවත් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට දුෂ්කර තත්වයක් ඇතිවීමය.

විපක්ෂය කියන්නේ රජය නැති නම් භාණ්ඩාගාරය බොරු කරනවා කියන එකය. සල්ලි තියාගෙන නොදෙන බවය. කොහොමත් රජය සතුව සල්ලි නැතැයි කියන එක එහෙමට විශ්වාස කරන්න පුලුවන් දෙයක් නොවෙයි. රජය බදු එකතු කරනවා නම්, ව්‍යාපාර කරනවා නම්, රජයේ නාමයෙන් වැඩ කරමින් සිටින බව පෙනෙන්න තිබෙනවා නම් සල්ලි තිබිය යුතුය. මේ නිසා මේ විපක්ෂය කියන කතා විශ්වාස කිරීමට පුරවැසියා පෙළඹීම සිදුවීම සාමාන්‍ය දෙයකි. විපක්ෂය දැන් කරන්නේ ඒ විශ්වාසය පාවිච්චි කර පුරවැසියා රවටා රජයට එරෙහිව පාරට බැස්සවීමය.

යම් අවශ්‍යතාවයකට මුදල් හදිස්සියක් වෙනවා නම් කවුරුත් කරන්නේ සල්ලි ණයට සොයාගැනීමය. නැතිනම් තියෙන දේපලක් විකුණා සල්ලි කරගැනීමය. රජයකට වුවත් සරලවම කරන්න තියෙන්නේ එයමය. නමුත් රජයට වෙනත් වරප්‍රසාදයක් තිබේ. ඒ ණය ගන්න නොහැකි නම් සල්ලි අච්චු ගැසීමය. හැත්ත පස් වසරක් මුළුල්ලේ කරගෙන ආවේ එයය. රජයේ වියදම්වලට සරිලන ආදායමක් කිසිදා තිබුණේ නැත. එහෙත් දැන් එහෙම කළ හැකියාව ද සීමා වී ඇත. රජයේ එදිනෙදා අනිවාර්ය වියදම් පියවා ගැනීමටවත් ආදායමක් රජයට දැන් නැත. ගෙවුණු ජනවාරි මාසයේ වියදම් වෙනුවෙන් රුපියල් බිලියන 367.8ක් රජය වැය කර තිබිණි. නමුත් ජනවාරියේ ආදායම බිලියන 158.7කට සීමා විය. අද රජයේ එකම ආදයම් මාර්ගය බවට පත්ව තිබෙන බදු ආදායමින් රජයට මාසික වියදම් ප්‍රමාණය බේරා ගැනීමටවත් නොහැක. රාජ්‍ය ව්‍යාපාරවලින් ලැබෙන්නේ පාඩු මිස ලාබ නොවේ. පාඩු ලබන විට එම පාඩු වෙනුවෙන් බර දරන්න වී ඇත්තේ රජයටය. මේ නිසා කළ යුතු වැඩ කරන්න වී ඇත්තේ ණය ගැනීම මතය. විදේශ ණය ගැනීමේ හැකියාවක් රජයට නැත. ගෙවන්න තිබුණු ණය ගෙවා ගන්නත් නොහැකිව රට බංකොළොත් කියා ණය හිමියන්ට කීවේ මීට මාස 6කටත් පෙරය. ණය ගැනීමට ඉතුරුව ඇත්තේ රට තුළින්මය. භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් ආදියෙන් එය සිදු කරගනී. නමුත් ඉවක් බවක් නැතිව ඒ වැඩේ කළ නොහැක. එහි සීමාවක් තිබේ. එහෙම නොවුණහොත් රටේ ආර්ථික පද්ධතියම නැවත කඩා වැටේ, බැංකු පද්ධතිය කඩා වැටේ. එසේම පොලී අනුපාතයන් පාලනය කළ යුතුය උද්ධමනය පාලනය කළ යුතුය. විශේෂයෙන්ම ඩොලර් සංචිතය ඉහළ දමා ගැනීම විය යුතුය. ඩොලර් රජයට නිකම් ලැබෙන්නේ නැත. ඩොලර් මිලදී ගන්න රුපියල් අවශ්‍යය. එමෙන්ම ඩොලරයේ රුපියල් අගය නිසියාකාරව පවත්වාගෙන යායුතුය. ඒ සඳහා ගණන් පියවරයන් සමඟ රටේ අනෙකුත් ආර්ථික මෙහෙයුම් පාලනයකට යටත් විය යුතුය. මේ ආදී වශයෙන් එකිනෙක ගැටගැසුණු සංකීර්ණ ප්‍රශ්න සමුදායක් විසඳමින් රාජ්‍ය ආදායම් දැඩි පාලනයකට යටත් කර ගනිමින් විය පැහැදම් කිරීමට සිදුව තිබේ.

මේ වන විට රටේ ඖෂධ හිඟය සම්බන්ධයෙන් ඇත්තේ අනතුරක සේයාවකි. ඉදිරි දින කිහිපය තුළ මෙම ඖෂධ හිඟය පුරවා ගැනීමට රජය අපොහොසත් වුවහොත් රටම වැටෙන්නේ ලෙඩ ඇඳටය. ඖෂධ නොමැතිව රෝගීන් මිය යන්නට ගතහොත් ඇතිවන තත්වයේ බරපතලකම කාටත් තේරුම් යා යුතුය, කොවිඩ් වසංගත තත්වය තුළ ප්‍රතිශක්තීකරණ එන්නත්, ඔක්සිජන්, වෙන්ටිලේටර් පමාවීම, ඇඳන් හිඟය ආදිය නිසා සිදුව තිබූ කලබගෑනිය යළි සිහිපත් කළ යුතුය. එදා එහෙම වුණේ රජය සතුව සල්ලි තිබිලාය. අවශ්‍ය නම් සල්ලි අච්චු ගැසීමේ හැකියාව ද තිබිලාය. ඩොලර් බිලියන 7ක පමණ විදේශ සංචිතයකුත් තිබිලාය. නමුත් අවශ්‍ය වේලාවේදී එම එන්නත් හෝ අනෙක් පහසුකම් නොලැබීම නිසාම මියගිය දහස් ගණනක් සිටියේය. ඒ එක රෝග තත්වයක් නිසය. ඉදිරියේදි එතැයි කියන ඖෂධ හිඟය සහ උපකරණ හිඟය කියන්නේ ඊට වඩා බරපතල වන ප්‍රශ්නයකි.

අද විදේශ සංචිත බිලියන් ගණනින් නැත. ඩොලර් මිලියන් හාරසිය ගණනක් එකතු වුණේ මේ ඊයේ පෙරේදාය. භාණ්ඩාගාරයේ රුපියල් නැත. බදු වැඩි

**අද විවිධ ඉල්ලීම් ඉල්ලමින් විදී බහින කිසිවකුත් රට ඉදිරියේ පවතින අනතුර ගැන කිසිදු තැකීමක් කරන්නේ නැත. සිතාගෙන සිටින්නේ මේ 2019ට පෙර රට කියාය. එදා යහපාලන රජය ගොඩනගා ගෙන තිබු ආර්ථික ස්ථාවරත්වය නිසා මෙහෙම සටන් කර දිනාගත හැකි දේවල් තිබුණත් අද එය කළ නොහැකිය. රනිල් බාර ගත්තේ මුළුමනින්ම බංකොළොත් කර තිබූ රටකි. කිසිවෙක් බාර ගැනීමට ඉදිරිපත් නොවූ රටකි. අමු සොහොනක් වන්නට ඉඩ තිබූ රටකි. මේ නිසා ඉල්ලීම් දිනා ගන්නට පෙර අඩුම තරමින් රජයට අනෙක් සියළුම දේ පසෙකලා හෝ එම ඉල්ලීම ඉටු කිරීමේ හැකියාවක් හෝ තිබෙනවාද කියා අවබෝධයක් මේ විදී සටන්කරුවන්ට තිබිය යුතුය. එසේ නොමැතිව තමන්ගේ මුග්ධභාවය, තකතීරුකම, ජඩකම ප්‍රදර්ශනය කිරීමක් පමණක් සිදුවෙනු ඇත. එසේම රටේ ඇත්ත තත්වය දැනගෙන පාරට බහිනවා නම් ඒ අමු තක්කඩිකමකි. ද්වේශ සහගත වුවමණාවකි.**

කළ ද එම ආදායම් තවම බලාපොරොත්තු මටට්මට ආවේත් නැත. ඒ ආවත් රජයේ වියදම් පියවන්න එය ප්‍රමාණවත් නැත. මේ නිසා තත්වය පාලනය කිරීම වෙනුවෙන් අවශ්‍ය මුදල් සොයා ගැනීමට මේ මාසයේ සම්පූර්ණ රාජ්‍ය ආදායම යොදා ගැනීමට කටයුතු කරන ලෙස ජනාධිපතිරවයා පසුගියදා බලධාරීන්ට නියෝග කර තිබිණි. එසේම මීට පෙර කැබිනට් තීරණයක් ගෙන තිබුණේ, රජයේ පුනරාවර්තන (වැටුප්, දීමනා ආදී) වියදම්වලින් සියයට 6ක් කැපීමට ගත් තීරණයට සමගාමීව එලෙස ඉතිරි කරන මුදලින් සීයයට 1ක ප්‍රමාණයක් ඖෂධ වෙනුවෙන් යොදා ගැනීමටය. කෙසේ නමුත් එම මුදල එකතුවීමක් සිදුවන්නට පෙර ඖෂධ හිඟයට වඩා වේගයෙන් ඉදිරියට පැමිණ තිබේ. ඒ අනුව සමස්ත මාසික රාජ්‍ය ආදායම ඒ වෙනුවෙන් වැය කිරීමේ තීන්දුව ගෙන තිබේ.

ඖෂධ හිඟය කියන්නේ එක ගැටලුවකි. තවත් විසඳන්න ගැටලු කප්පරක් තිබේ. රජය ආදායමම ඖෂධ වෙනුවෙන් යෙදවූ විට අනෙක් ගැටලු විසදීමත් අර්බුදයට යයි. රාජ්‍යය මුහුණ දී තිබෙන මේ සංකීර්ණ තත්වයන් නොසලකා. විපක්ෂය උදේ හවා සටන් කරන්නේ තමන්ගේ බලය වෙනුවෙන් තිබෙන මළපෙරේතකම සපුරා ගැනීමේ මැතිවරණ ඉල්ලීම දිනා ගන්නය. මේ මැතිවරණය පැවැත්වූවා කියා ආර්ථික අර්බුදය විසඳන්න සේවයක් කරන්නේ නැත. අනිවාර්යයෙන්ම තිබෙන තත්වයත් තව දුරටත් දුෂ්කරවීමක් හැර වෙනකක් සිදු නොවෙයි. විපක්ෂයට අවශ්‍යව ඇත්තේ රට එතැනට තල්ලුකර තමන්ගේ බල ලෝබී මජර ආශාවන් මුදුන් පත් කර ගැනීම බව පැහැදිලිය. මැතිවරණ කොමිසමත් කරන්නේ ඊටම උල්පන්දම් දෙන එකය.

පවතින ආර්ථික අර්බුදය විසඳා ගැනීම වෙනුවෙන් විවර වී ඇති එකම මාර්ගය වී ඇත්තේ ජත්‍යන්තර මුල්‍ය අරමුදලේ සහයෝගය පමණක් බව අද විපක්ෂයට පවා පිළිගන්න වී ඇති සත්‍යයකි. ඒ හරහා ලැබෙන සහය මත රටේ ආර්ථික ක්‍රියාකාරකම් මේ වන විට තීරණය කර තිබෙන ප්‍රතිසංස්කරණ යෝජනා සමඟ පිළිවෙලකට විය යුතුය. විදේශ ණය ආධාරයක් හෝ ලබා ගත හැකි වන්නේ ඒ අනුවය. නමුත් මේ වන තෙක් ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සහය ලබාගැනීමට හැකිව නැත. එය තවදුරටත් ප්‍රමාද වෙමින් තිබේ. ඒ රජයේ ප්‍රමාදයක් නොව මේ ණය සහන ලබා ගැනීම වෙනුවෙන් අනෙක් රාජ්‍යයන් සමඟ වන ණය ගනුදෙනුවලට ප්‍රමාණවත් ගෙවීමේ කාලයක් ලබා ගැනීම වෙනුවෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් විය යුතුය. නමුත් ණය හිමි රාජ්‍යයන් ගණනාවකගේ සහය ලැබී තිබුණත් චීනයේ සහය ලබා ගැනීම තවදුරටත් සාකච්ඡා මට්ටමේ තිබේ. චීනයේ සහය රටට ලැබුණත් එය මුල්‍ය අරමුදලට පිළිගත හැකි මට්ටමේ විය යුතුය. දැනට ප්‍රශ්නය හිරව ඇත්තේ එතැනය. කොහොම නමුත් මේ සාකච්ඡා සාර්ථක වෙනු ඇති බවට විශ්වාසය පළව තිබේ. මෙය ප්‍රමාදවීම නිසා රටේ අර්බුදය විසඳා ගැනීම වෙනුවෙන් වන මූලික පියවරම ප්‍රමාද වී ඇත.

මේ තත්වයන් හමුවේ විපක්ෂය ආණ්ඩු බලය ඩැහැ ගන්න ගන්නා උත්සහය තුළ සිදු වී ඇත්තේ සියළු සාකච්ඡා එකඟතාවයන් බිඳ වැටී යළි මුල සිටම මුල්‍ය අරමුදලේ සහය පතා නහයෙන් හැඬීමට සිදුවීමය. මුල්‍ය අරමුදල වත්මන් රජය සමඟ වන එකඟතා අහෝසි කරන බව සජබය දැනටමත් ප්‍රකාශ කර තිබේ. මේ වන විට දියත් කර තිබෙන ආර්ථික ප්‍රතිසංස්කරණයන් හකුළන බව සජබයත්, ජාජබයත් ප්‍රකාශ කර තිබේ. මේ අනුව මේ කවරකු බලයට ආවත් වෙන්න නියමිත රට නැවත ගැඹුරු ප්‍රපාතයකට කඩා වැටීම පමණය. මේ පවතින තත්වයෙන් යළි කඩා වැටීමක් කියන්නේ පසුගිය අප්‍රේල් මාසයේ සිටි තැනිනුත්, පතුලක් නොපෙනෙන ආගාධයකට වැටෙනවා කියන එකය.

අද විවිධ ඉල්ලීම් ඉල්ලමින් විදී බහින කිසිවකුත් රට ඉදිරියේ පවතින අනතුර ගැන කිසිදු තැකීමක් කරන්නේ නැත. සිතාගෙන සිටින්නේ මේ 2019ට පෙර රට කියාය. එදා යහපාලන රජය ගොඩනගා ගෙන තිබු ආර්ථික ස්ථාවරත්වය නිසා මෙහෙම සටන් කර දිනාගත හැකි දේවල් තිබුණත් අද එය කළ නොහැකිය. රනිල් බාර ගත්තේ මුළුමනින්ම බංකොළොත් කර තිබූ රටකි. කිසිවෙක් බාර ගැනීමට ඉදිරිපත් නොවූ රටකි. අමු සොහොනක් වන්නට ඉඩ තිබූ රටකි. මේ නිසා ඉල්ලීම් දිනා ගන්නට පෙර අඩුම තරමින් රජයට අනෙක් සියළුම දේ පසෙකලා හෝ එම ඉල්ලීම ඉටු කිරීමේ හැකියාවක් හෝ තිබෙනවාද කියා අවබෝධයක් මේ විදී සටන්කරුවන්ට තිබිය යුතුය. එසේ නොමැතිව තමන්ගේ මුග්ධභාවය, තකතීරුකම, ජඩකම ප්‍රදර්ශනය කිරීමක් පමණක් සිදුවෙනු ඇත. එසේම රටේ ඇත්ත තත්වය දැනගෙන පාරට බහිනවා නම් ඒ අමු තක්කඩිකමකි. ද්වේශ සහගත වුවමනාවකි. රටට ද්‍රෝහීවීමකි. සත්‍ය වශයෙන්ම මේ වෙලාවේ අවශ්‍ය වන්නේ ඉල්ලීම් දිනාගැනීම වෙනුවෙන් ඊට හැකියාවක් සහිත රටක් ගොඩනැඟීම වෙනුවෙන් වන සටනකි. අරගලයකි. යුද්ධයකි. එසේ නොවන කිසිදු දෙයකට මේ රට තුළ අවසරයක් නොතිබිය යුතුය. මන්ද මේ යන ගමන අතුරේ යනවාටත් වඩා අවදානම්කාරී ගමනක් නිසාය. අත ඇතැරුනොත් සෙත්තපෝච්චි පමණක් නොවෙයි, යළි අතුරේ යවන්න මිනිහෙක් හොයා ගන්නත් වෙන්නේ නැත. රනිල්ට ඉඩ දිය යුත්තේ ඒ නිසාය.

සෝෂක

# එන්න අපි පාරට බහිමු



පසුගිය පෙබරවාරි 14 ආදරවන්තයින්ගේ දවසේ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මොණරාගල පැවැති ජාතික ජන බලවේගයේ ඡන්ද රැස්වීමක් අමතා රටපුරා ජනතාවට ආරාධනාවක් කළේය. ඒ "**අපි සැලසුම් කරලා තමුන්නාන්සේලාට කියන්නම්, එදාට පාරට බහින්න ලෑස්තිවෙලා ඉන්න**" කියාය. ජවිපෙ නායකයා මෙවැනි ප්‍රකාශයක් සිදු කළේ එදින පෙබරවාරි මැතිවරණ කොමිසම කරන ලද ප්‍රකාශයක් පාදක කරගෙනය. ඒ මුදල් ගෙවීමකින් තොරව පළාත් පාලන මැතිවරණයට අදාළ මුද්‍රණ කටයුතු සිදු කළ නොහැකි බවට රජයේ මුද්‍රණාලයේ අධිපතිනිය මැතිවරණ කොමිසමට දැනුම්දීමෙන් පසු ඇති වී තිබෙන තත්වය ගැන මැතිවරණ කොමිසම සහ දේශපාලන පක්ෂ ලේකම්වරු අතර පැවැත්වූ සාකච්ඡාවක් අවසානයේ දී පෙබරවාරි 15 සැලසුම් කළ පරිදි තැපැල් ඡන්ද පත්‍රිකා බෙදා හැරීමට නොහැකි බව කරන ලද ප්‍රකාශයයි. මෙම ප්‍රකාශය ජනමාධ්‍ය හරහා ප්‍රචාරය වූයේ දින නියමක් නොමැතිව තැපැල් ඡන්දය කල් දමා ඇත කියාය.

මෙම ප්‍රකාශය පාදක කරගෙන ජවිපෙ නායකයා සිය දේශපාලන ඉලක්කය සපුරා ගැනීමේ අරමුණින් බරපතළ තීන්දුවක් ගෙන ඇති බව පැහැදිලිය. ඒ ආර්ථික අර්බුදයකින් පීඩා විඳින රට අරගලකාරී අරාජිකත්වයකට ඇද දැමීමට උත්සාහ කිරීමයි. ඔවුන්ගේ උත්සාහය මැතිවරණය කල් දැමීම ආණ්ඩුවේ වැඩක් බව සමාජයට ඒත්තු ගන්වා නැවතත් මහපාරට මිනිස්සු ගෙන්වා ගෙන, රාජ්‍ය මර්දනය කැඳවාගෙන රට තවදුරටත් බරපතල අරාජිකත්වයකට ඇද දැමීමටයි. එවිට මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධී යැයි ද අර්බුදයෙන් අර්බුදයට රට තල්ලු කරමින් සිටිනවා යැයි ද වහාම ආණ්ඩුව පන්නා දැමිය යුතු යැයිද ඔවුන් විසින් සමාජගත කරමින් ඇති කුප්‍රකට පණිවිඩය මුවහත් කර ගත හැකිය. ඉන් ලැබන වාසි සහගත අවස්ථාවේ මේ අර්බුදයෙන් රට මුදවා ගත හැකි එකම ගැලවුම්කරුවා තමන් යැයි පවසා සිය ඡන්ද ගොඩ වැඩි කරගෙන රාජ්‍ය බලය ඩැහැ ගැනීමට උත්සාහ කිරීමයි. එය එක් අතකින් විපක්ෂයේ දේශපාලන පක්ෂයක් ලෙස අතිශය සාධාරණ විය හැකිය. නමුත් එය අපරාධයක් නොවන්නට නම්, අර්බුදය විග්‍රහ කරන අටුවා ටීකා ටිප්පනීවලට එහා ගිය අර්බුදයෙන් රට මුදවා ගත හැකි යැයි විශ්වාස කළ හැකි මට්ටමේ පැහැදිලි සැලසුම් සහගත වැඩපිළිවෙළක් ඔවුන් සතුව තිබිය යුතුය. අද තව වෙනතුරු එවැනි පැහැදිලි නිසි වැඩපිළිවෙළක් ඔවුන් සතුව ඇතැයි සමාජය හමුවේ තහවුරු කිරීමට අසමත්වීමම රැලි දේශපාලනයේ ඛේදවාචකයකි.

අනෙක් පසින් පළාත් පාලන මැතිවරණය පැවැත්වෙන දිනය නම් කළේ ද තැපැල් ඡන්ද පත්‍රිකා නියමිත දිනයට බෙදාහැරීමට නොහැකි බව ප්‍රකාශ කළේ ද මැතිවරණ කොමිසන් සභාව විසිනි. එය ද මැතිවරණ කොමිසමේ පෞද්ගලික වුවමනාවට ගත් තීන්දුවක් නොවන අතර මේ වන විට රටේ පවතින බරපතල මූල්‍ය අර්බුදය හේතුවෙන් මැතිවරණයක් වෙනුවෙන් මුදල් වෙන් කිරීමට මහා භාණ්ඩාගාරය සතුව මුදල් නොමැතිවීම හේතුකොට ගෙනය. මේ බව විපක්ෂයේ උදවිය මැනවින් දැන සිටිය ද ඔවුන් කියන්නේ, කෙසේ හෝ මැතිවරණය පැවැත්විය යුතු බවය.

අනුරලා, සජිත්ලා, ජී.එල්.ලා මේ කියන්නේ, දෛනික ආහාර වේලවත් නිසියාකාරයෙන් සරිකර ගැනීමට නොහැකි මේ රටේ දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් වෙන්කර ඇති සමාජ සුබසාධන මුදල ආපසු හරවා මැතිවරණයට එය වියදම් කරන ලෙසද? එලෙස මැතිවරණයට මුදල් වියදම් කළ පසු අන්ත දිළිඳු ජනයාගේ කුස පිරෙන බවද? නැතිනම් ආර්ථික අර්බුදය තවත් උග්‍රකරමින් මුදල් අච්චු ගසා මැතිවරණය පවත්වන්න කියා ද? එසේ නොමැති නම්, මේ රටේ සමස්ත ජනතාවගෙන් 10%කට අඩු ඉහළ ආදායම්ලාභීන්ට පැනවූ ආදායම් බද්දට එරෙහිව මාරාන්තික විරෝධයක් දක්වන විපක්ෂයේ මහත්වරුන්ට මේ රටේ අන්ත දුක් විඳින ලක්ෂ ගණනක් මිනිස්සු ගැන කිසිදු හැඟීමක් නැද්ද? තමන්ගේ බල දේශපාලන වුවමනාවන් සන්තර්පනය කරගැනීම වෙනුවෙන් එදා වේලවත් හොයාගන්න බැරි අසරණ මිනිස්සු බිල්ලට දෙන්න ද මේ විපක්ෂය කියන්නේ?

## පොකට් පිරෙන කොට පිකට් නැතිවෙනවා

පොකට් එකට වාසි වුණොත් පිකට් එකට අවාසියක් කියලා දේශපාලනය කරන සියල්ලෝම සහසුද්දෙන්ම දන්නා කරුණකි. එවැනි අවබෝධයක් සහිත ජනාධිපති රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයේ වැඩ භාරගත් පළමු මොහොතේ සිට මේ රටේ සියලු මිනිසුන් පොදුවේ මුහුණ දුන් ආර්ථික අර්බුදයට ක්ෂණික පිළියම් සොයා ආර්ථික ස්ථායිතාවයකට පත් කිරීමට කටයුතු කළේ ද ඒ හේතුවෙනි. තෙල් පෝලිම්, ගෑස් පෝලිම් අද නැත. එසේම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව ජනතාවට ලැබෙමින් පවතී. එපමණක් නොව කිසිවකු අත්නොහැරෙන සේ සමාජ සුබසාධන කාර්ය සැලසුම් සහගතව දියත් කරමින් සිටියි. තවද ආර්ථික කළමනාකරණය නිවැරදිව සිදු කළ යුතු බැවින් පුද්ගලිකවත් දේශපාලනිකවත් අවාසි සහගත වුව ද අසීරු තීන්දු තීරණ ගනිමින් රට යහමගට ගැනීමේ වැඩපිළිවෙළ පෝෂණය කරමින් සිටියි. මේ වැඩපිළිවෙළ තව කෙටි කාලයක් මේ ආකාරයට සාර්ථකව ක්‍රියාත්මක වුවහොත් විපක්ෂයේ බලදේශපාලන වුවමනාවන් සහිත පුද්ගලයන්ට බරපතළ අවාසියක් බව ඔවුන් තේරුම් ගෙන ඇති බව පැහැදිලිය.

පසුගිය කාලයේ අර්බුදයෙන් අර්බුදයට ගිය මේ රටේ ආර්ථිකය යම් ස්ථායිතාවයකට පත්ව රටේ සියලු වැසියන්ට තම තමන්ගේ කාර්යයන් නිදහසේ සිදු කරගත හැකි වාතාවරණයක් නිර්මාණය වුවහොත් අද දවසේ විපක්ෂයේ උදවිය ජනතාව ඉදිරියේ මවන සිහින මාළිගා ඇතුළට හෙට දවසේ මිනිසුන් ගාල් වෙන්නේ නැත. පිකටිං, උද්ඝෝෂණ, අරගල හෝ කඩාකප්පල්කාරී කිසිදු කාර්යයකට ජනයා සහභාගී නොවනු ඇත. එය විපක්ෂයට සහමුලින්ම අවාසියකි. ඒ නිසාම හැකි සෑම අවස්ථාවක්ම උපයෝගී කොටගෙන ඔවුන් සිදු කරමින් සිටින්නේ, සමාජ ආර්ථික අර්බුදය නඩත්තු කිරීමට කටයුතු කිරීම සහ එය තව තවත් පීඩාකාරී වන තැනට කටයුතු කිරීමයි. විපක්ෂයේ උදවිය පසුගිය කාලය පුරාම සිදු කළ සෑම ක්‍රියාකාරකමක් දෙසම විමසිලිමත්ව බැලූ කළ එය පැහැදිලිව හඳුනාගත හැකිය.

"විපක්ෂයේ මේ වැඩවලින් රට අරාජික වුවද ආර්ථික අර්බුදය තව තවත් දරුණු පීඩාකාරී වුවද එය ඔවුන්ගේ ප්‍රශ්නයක් නොව ආණ්ඩුවේ ප්‍රශ්නයකි. විපක්ෂයේ පැහැදිලි කිරීම එයය. ඒ අනුව විපක්ෂය දැන් දැන් අර අදින්නේ නැවතත් ආණ්ඩු විරෝධී අරගලයකට ජනතාව පොළඹා ගැනීමටය. ජවිපෙ නායක අනුර දිසානායකගේ මොණරාගල කන්නලව්ව ඒ වෙනුවෙන්ය. ගෝඨා ගෝ හෝම් පන්නයේ අරගලයක් නැවතත් කැඳවීම යනු මේ වන විට දරුණු ඇදවැටීමකට ලක්ව ඇති රටේ සමාජ ආර්ථික දේහය තවදුරටත් ගැඹුරු අගාධයක් වෙත ඇදගෙන යාමකි. කාලාන්තරයකට ගොඩගත නොහැකි රටක් නිර්මාණය කිරීමකි. මන්ද ගෝඨා ගෝ හෝම් අරගලය රට පුරා ගිනි පූජාවකින් අවසන් කළ නමුත් දැන් මේ කන්නලව් කරන්නේ ගිනි පූජාවකට එහා ගිය බිලි පූජාවකට වන බැවිනි. කෙතරම් ම්ලේච්ඡ වුවද එය විපක්ෂයේ මහත්වරුන්ට අදාළ නැත. ඒ බල දේශපාලන පෙරේතකම අන් සියල්ලටම වඩා උසස් යැයි ඔවුන් කල්පනා කරන බැවිනි."

## අරගලයේ කන්නලව්ව

විපක්ෂයේ උදවියගේ සූදානම පළාත් පාලන මැතිවරණයෙන් ආණ්ඩුව පෙරළා දැමීමටය. මැතිවරණ සමීක්ෂණ වාර්තා නිරීක්ෂණ කිරීමේදී පැහැදිලි වන්නේ, එය එතරම් පහසුවෙන් සිදු කළ හැක්කක් නොවන බවය. මන්ද සමගි ජන බලවේගයත්, ජාතික ජන බලවේගය සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත් තුන්කොන් සටනක නිරතව ඇති බැවිනි. මෙකී සමීක්ෂණ වාර්තා අනුව පළාත් පාලන මැතිවරණයේ පැහැදිලි තනි බලයක් එක් පක්ෂයකට ලැබෙන ආකාරයක් නිරූපණය නොකරන අතර බහුතරයක් පළාත් පාලන ආයතන තුළ අකමැත්තෙන් වුවද සන්ධාන ආණ්ඩු ගොඩනැගීමට සිදුවනු ඇත. එය ප්‍රාදේශීය පරිපාලනයට එතරම් හිතකර තත්වයක් නොවනු ඇත. ඒ මෙතෙක් කලක් සන්ධාන ආණ්ඩු අටවාගත් කිසිදු පළාත් පාලන ආයතනයක සාර්ථක පාලනයක් සිදු කර නොමැති බැවිනි. එය එසේ වුවද විපක්ෂයට අවශ්‍ය මැතිවරණය කෙසේ හෝ පවත්වා තමන්ගේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කිරීමය.

විපක්ෂයේ මේ වැඩවලින් රට අරාජික වුවද ආර්ථික අර්බුදය තව තවත් දරුණු පීඩාකාරී වුවද එය ඔවුන්ගේ ප්‍රශ්නයක් නොව ආණ්ඩුවේ ප්‍රශ්නයකි. විපක්ෂයේ පැහැදිලි කිරීම එයය. ඒ අනුව විපක්ෂය දැන් දැන් අර අදින්නේ නැවතත් ආණ්ඩු විරෝධී අරගලයකට ජනතාව පොළඹා ගැනීමටය. ජවිපෙ නායක අනුර දිසානායකගේ මොණරාගල කන්නලව්ව ඒ වෙනුවෙන්ය. ගෝඨා ගෝ හෝම් පන්නයේ අරගලයක් නැවතත් කැඳවීම යනු මේ වන විට දරුණු ඇදවැටීමකට ලක්ව ඇති රටේ සමාජ ආර්ථික දේහය තවදුරටත් ගැඹුරු අගාධයක් වෙත ඇදගෙන යාමකි. කාලාන්තරයකට ගොඩගත නොහැකි රටක් නිර්මාණය කිරීමකි. මන්ද ගෝඨා ගෝ හෝම් අරගලය රට පුරා ගිනි පූජාවකින් අවසන් කළ නමුත් දැන් මේ කන්නලව් කරන්නේ ගිනි පූජාවකට එහා ගිය බිලි පූජාවකට වන බැවිනි. කෙතරම් ම්ලේච්ඡ වුවද එය විපක්ෂයේ මහත්වරුන්ට අදාළ නැත. ඒ බල දේශපාලන පෙරේතකම අන් සියල්ලටම වඩා උසස් යැයි ඔවුන් කල්පනා කරන බැවිනි.

## ඡන්ද තියන්න රටක්

නිසි කලට මැතිවරණ පැවැත්වීම ප්‍රජාතන්ත්‍රවාදී රටක ආණ්ඩු පාලකයන්ගේ ප්‍රමුඛ වගකීමකි. එහි විවාදයක් නැත. ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ අවසාන ඉලක්කය ද අසීරුම මොහොතක පවා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම වන බැවිනි. එය මැනවින් ජනපති රනිල් දනී. නමුත් අද අපි සිටින්නේ, මැතිවරණයක් පැවැත්වීමට තරම් හැකියාවක් සහිත රටක නොවන බව තේරුම් ගත යුතුය. පසුගිය කාලය පුරාම ආණ්ඩුවේ දේශපාල බලාධිකාරය පමණක් නොව රජයේ නිලධාරීන් ද මේ පිළිබඳ කරුණු අනාවරණය කර තිබිණි. ඕනෑම ආණ්ඩුවක මහා භාණ්ඩාගාරය මුදල් වෙන් කරනු ලබන්නේ, නිසි ප්‍රමුඛතා ලැයිස්තුවක් අනුවය. මේ මොහොතට අදාළව ගත් විට ලංකාවේ ප්‍රමුඛතම කාර්යය රටේ මිනිසුන් ජීවත් කරවීමය. ඒ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට සිදුව ඇත. සමාජ සුබසාධන වැඩපිළිවෙළ දියත් වන්නේ ඒ වෙනුවෙනි. එවන් මොහොතක මැතිවරණයකට රුපියල් මිලියන 10,000ක් වැනි අති විශාල මුදල් සම්භාරයක් යට කිරීම යනු ආර්ථික අවපාතයේ පහළම ස්ථරයේ අසීරුවෙන් දිවි ගෙවන දහස් ගණනක මිනිසුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නයක් නොවේ යැයි කිසිවකුට සාධාරණීකරණය කළ හැකි නොවේ.

ඒ අනුව මේ මොහොතේ ජනතාවට තෝරාගැනීම් දෙකක් ඇත. එක විපක්ෂයේ උදවිය කියන ආකාරයට රට තව තවත් අරාජිකත්වයට ඇද දමා හෝ මැතිවරණය පවත්වා ඉන් ජයගන්නා දේශපාලන පක්ෂයට හෝ කණ්ඩායමට රට සුඛිත මුදිත කිරීමට අවස්ථාව ලබාදීමයි. දෙවැන්න, මේ සා විශාල ආර්ථික අර්බුදයකට ලක්ව ඇති රටේ බලදේශපාලන වුවමනාවන් සහිත කිහිප දෙනෙකුගේ සිත් සුවපත් කිරීමේ අරමුණින් මැතිවරණයකට ප්‍රමුඛතාවය ලබාදීම වෙනුවට නිදහසේ මැතිවරණයක් පැවැත්විය හැකි ආර්ථික ස්ථායිතාවයක් සහිත රටක් ගොඩනැගීමට එකතුවීමය.

මේ කරුණු ද්විත්වයෙන් එකක් අනිවාර්යෙන් තෝරා ගත යුතුව ඇත. එය තමන් වඩාත් කැමැති දේ නොව වඩාත් නිවැරදි දේ විය යුතුය. රට වැසියාගේ ජීවිත සුරක්ෂිත කරන තීන්දුවක් විය යුතුය. රට තවත් අඳුරේ හෙළන තීන්දුවක් නොවිය යුතුය.

දේශපාලන වෙනස්කම් කොතෙක් තිබුණ ද එකිනෙකාට වෙනසක් නොකරන තීන්දුවක් විය යුතුය. සියලු පුරවැසියාම ඒ වෙනුවෙන් පෙළගැසිය යුතුය. පටු දේශපාලන අවස්ථාවාදයට රට විනාශ කිරීමට ඉඩ නොදිය යුතුය. එවිට සමස්ත පුරවැසියාම දෑත් ඔසවා ඔල්වරසන් නගනු ඇත.

නවන් පතිරත්න

Mr. President

# මේ ප්‍රශ්න හැදුවේ මම නොවෙයි හිටපු ජනාධිපතිතුමා



## ආතල් කඩන්න නරකයි

යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කිරීමට ඉකුත් සෙනසුරාදා එහි ගිය ජනපති රනිල් ප්‍රමුඛ පිරිසට අතරමගදී මනරම් කුඹුරු යායකට ගොඩ වැදීමට ද අවස්ථාව උදාවූවේය. සංස්කෘතික ආයතනය විවෘත කිරීමෙන් පසු සංස්කෘතික සංදර්ශනය නැරඹීමට ද ජනපති රනිල්, කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල, ජනපති ලේකම් සමන් ඒකනායක, උපදේශක රුවන් ආදී පිරිසක් සමඟ එක්ව සිටියෝය.

සංස්කෘතික සංදර්ශනය නරඹමින් සිටින අතරතුර ජනපති ආරාධිතයන් දෙසට හැරී කීවේ "අපි මෙතන ඉන්න එක සාමාන්‍ය ජනතාවට මේක බලන්න බාධාවක්. ආරක්ෂකයෝ නිසා ජනතාවට පහසුවෙන් බලන්න බෑ" කියාය.

එයින් පසු ඔවුන් එතනින් නික්මීමත් සමගම ආරක්ෂක රැකවල් ඉවත්වීම නිසා ජනතාවට වේදිකාව ආසන්නයටම පැමිණ සංස්කෘතික සංදර්ශනය නැරඹීමේ අවස්ථාව උදා වූවේය. පසු දින කොළඹ බලා පිටත්වීමට සූදානම් වෙමින් සිටි ජනපතිට නිලධාරියෙකු පැමිණ කීවේ කිලිනොච්චි පන්නකාඩ් ප්‍රදේශයේ හොඳින් පීදුණු කුඹුරු යායක් පවතින බවට වූ ආරංචියකි. ඔහු ඒ පණිවුඩය ගෙනාවේ එවැනි තැනක් ඇතිදැයි සොයා බලන ලෙස රනිල් කළ දැනුම්දීමකට අනුවය.

ලද ආරංචියත් සමගම ජනපති ඇතුළු කණ්ඩායම ක්ෂණිකව එම පෙදෙසට යාමට තීන්දු කළේය. කිසිවෙකු නොසිතූ මොහොතක පැමිණි ආගන්තුකයා ගැන ජනතාවට ඇතිවූවේ මහත් උද්යෝග යකි. කෙටි දැනුම්දීමකින් පිටත්වීම නිසා ආරක්ෂකයන් වැඩි ප්‍රමාණයක් නොසිටීමෙන් ජනපතිට ජනතාව අතරට තනිව ගොස් කතා බහ කිරීමේ අවස්ථාව උදාවූවේය.

## රටටම බත යාපනයෙන්

ගොවීන් හමුවට ගිය ජනපති රනිල් ගොවිතැන ගැන විමසා සිටියේය. "සර් අපිට අවශ්‍ය පහසුකම් දෙනවා නම් අපිට හොඳ අස්වැන්නක් රටට දෙන්න පුළුවන්" ගොවීහු කීහ.

"හරි මම පොහොර, බෙහෙත් වගේ අවශ්‍ය ඔක්කොම දෙන්නම් ඔයාලා මට රටටම කන්න හාල් ටික දෙන්නකෝ" ජනපති කීවේ සිනාසෙමිනි.

ප්‍රදේශය ගැන ජනපති විස්තර කරද්දී ගොවී ජනතාව ද අසා සිටියේ පුදුමයෙනි. ජනපති එම ස්ථානයෙන් පිටත්ව ගිය පසු ඔවුනොවුන් කතාවූයේ ජනපතිට තමන්ට වඩා දැනුමක් ප්‍රදේශය ගැන තිබෙන බව කියමිනි.

එහි සිටි වයස්ගත ගොවියෙකු කොළඹින් ගොස් සිටි පිරිස හමුවේ කීවේ "යුද්දෙට කලින් තිබ්බ ජනාධිපතිවරණයේදි කොබ්බෑකඩුව මහත්තයා ආවම අපි ඉල්ලුවේ කාරණා දෙකයි. එකක් අධ්‍යාපනය අනික කෘෂිකර්මාන්තය. අද වත්මන් ජනාධිපතිතුමාම අපි ළඟටම ඇවිල්ලා ඒක කියනවා" කියාය.

පොහොර ගැටළුව විසඳීමත් වී කිලෝවක් වෙනුවෙන් රුපියල් 100ක මුදලක් ගෙවීමටත් ජනපති රටටම පොරොන්දු වූවේ එහි සිටය. ඉරිදා සවස කොළඹ පැමිණි ජනපති රනිල් සඳුදා පෙරවරුවේම ගියේ ඇමරිකානු තානාපති කාර්යාලය වෙතය. ඒ ඇමරිකානු තානාපති කාර්යාලය සූදානම් කර තිබූ තරුණ හමුවකට සහභාගී වීමටය.

## තරුණ ප්‍රශ්න කෙළින්ම අහන්න

ශ්‍රී ලංකාව හා ඇමරිකානු එක්සත් ජනපදය අතර සබඳතාවලට 75 වසරක් සැපිරීම වෙනුවෙන් ඇමරිකානු තානාපති කාර්යාලය නායකත්ව සංසඳ සමුළුවක් සංවිධානය කර තිබුනි. ඊට එක්වූ ජනපති තරුණයන් අමතා කතාවක් කිරීමෙන් පසුව සැවොම ඉදිරි කටයුතුවලට යාමට සූදානම් වූවත් ජනපති රනිල් තරුණයන්ට ඔහුගේ ප්‍රශ්න ඇත්නම් විමසන ලෙස දැනුම් දුන්නේය.

තරුණ තරුණියන් රැසක් ජනපතිට ප්‍රශ්න ඉදිරිපත් කළ අතර ඔහු ඒ සියල්ලටම පරිපූර්ණ පිළිතුරු ලබා දුන්නේය. එයින් ද නොනැවතී තේ පැන් සංග්‍රහය අතරතුර ද ඔහු තරුණ තරුණියන් අසලට ගොස් නොයෙක් කරුණු විමසුවේය. අරගලය ගැන මෙන්ම "සිස්ටම් චේන්ජ්" ගැන ද ඔහු තරුණ තරුණියන් හා අදහස් හුවමාරු කර ගනු ලැබීය.

## සහන දෙන්න බිලියන 19ක් මෙන්න

ඔහු සඳුදා දින කාර්යාලයට පැමිණෙන විට දහවලට ආසන්නව පැවැතුනි. එදින ඉතා කාර්ය බහුල දිනයක් වූවේ ඇමති මණ්ඩල රැස්වීම ද පැවැති බැවිනි. ඔහු ඇමති මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබූවේ ජනතාවට සහන රැසක් ලබාදීම වෙනුවෙනි. දිළිඳු ජනතාවට සහල් කිලෝ 20ක් කිලෝ දහය බැගින් මාස දෙකක් ලබාදීමටත්, ඖෂධ මිළදී ගැනීමට හා සේවක පාරිතෝෂික ගෙවීම වෙනුවෙන් රුපියල් බිලියන 19 ක් වෙන් කරමින් එම කැබිනට් පත්‍රිකාව යොමු කර තිබුනි.

අගහරුවාදා උදෑසන ආරක්ෂක මණ්ඩල හමුවට එක්වූ ජනපති සවස නැවත කාර්යාලය වෙත පැමිණියේය. එදින සවස එක්සත් ජාතික පක්ෂ කළමනාකරණ මණ්ඩල නිලධාරීන් පැමිණ සිටියේ පක්ෂයේ ඉදිරි කටයුතු ගැන ජනපතිට දැනුම් දීමටය. පළාත් පාලන මැතිවරණය ගැන ද එහිදි කතා බහට ලක්වූවේය.

## ඔය ඉල්ලීම වැඩේ අවුල් කරන්න

කතාව ආරම්භයේදීම ජනපති කීවේ මැතිවරණ කටයුතුවලට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නොමැති බවය. "මැතිවරණ කොමිසම සල්ලි ඉල්ලනවා. අනෙක් පැත්තෙන් මුද්‍රණාලායාධිපතිනිය සල්ලි නැත්නම් ඡන්ද කාඩ් ගහන්න බෑ කියනවා" මහලේකම් රංගේ කතාව ආරම්භ කළේය.

"හිගන්නොත් පාරේ ඉඳලා සල්ලි ඉල්ලනවා. පුළුවන් අය දෙනවා. බැරි අය යනවා" වජිර කීවේ සැවොම සිනා ගන්වමිනි.

"කොහොම වුනත් අපි දන්න තරමින් මහාභාණ්ඩාගාරයට දෙන්න සල්ලි නෑ. විපක්ෂයේ කණ්ඩායම්වලට තිබුණේ මුලින්ම ජනාධිපතිතුමා කියපු සභිකයෝ 8000 සියයට 50 කින් අඩු කරන යෝජනාව ක්‍රියාත්මක කරලා ඡන්දයකට යන්නයි" ජාතික සංවිධායක සාගල කීවේ එවැන්නකි.

"එහෙම වුනා නම් අගෝස්තු - ඔක්තෝම්බර් අතර කාලය තුළ මැතිවරණය ඉතාම හොඳින් තියන්න තිබුණා" නියෝජ්‍ය නායක රුවන් ද කතාවට අලගු තැබුවේය.

"විපක්ෂයේ කොටස් දෙකක් ඡන්දය වෙනුවෙන් කඩා ගෙන ගියා. මෙතන ගොඩක් අයට ඕන වුනේ ජනාධිපතිතුමා ගෙනියන වැඩපිළිවෙල කඩාකප්පල් කරලා එතුමාව වට්ටන්න" අකිල ද කතාවට එකතු වූවේ එලෙසිනි.

"මම දැන් වුනත් ලැහැස්තියි පාර්ලිමේන්තුවේ සියලු කණ්ඩායම් එක්ක එකතු වෙලා ආර්ථිකය ගොඩ දාලා සභික ගණන අඩු කරලා ඡන්දයකට යන්න. මම දැනුත් ආරාධනා කරනවා ඔක්කොටම මේ වැඩපිළිවෙලට එකතු වෙන්න කියලා" ජනපති කීවේ බැරෑරුම්වය.

## විපක්ෂයේ චණ්ඩි පාට්

"කොහොමවුනත් විපක්ෂ කණ්ඩායම් නිලධාරීන්ව බිය වද්දනවා. ඔවුන් කියන්නේ මුදල් ලේකම්, මුද්‍රණාලයාධිපති, මැතිවරණ කොමිසමේ අය ගෙනල්ලා ජනාධිපති කාර්යාලයේ ඉඳන් මැතිවරණය කඩාකප්පල් කරන්න කුමන්ත්‍රණ කරනවා කියලා" ශමල් සෙනරත් කියද්දී ජාතික සංවිධායක සාගල කීවේ නිලධාරින්ට ජනපති හමුවී තමන්ට තිබෙන ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමට බාධාවක් නැති බවය.

පක්ෂ කටයුතු ගැන තීන්දු තීරණ ගැනීමට පක්ෂ කෘත්‍යාධිකාරි මණ්ඩලය සිකුරාදා දින පක්ෂ නායක ජනපති රනිල්ගේ මූලාසනයෙන් රැස්වීමට කතිකා කර ගනිමින් පිරිස පිටත්ව ගියහ.

කෘෂිකර්ම නිලධාරීන් හා ආරක්ෂක නිලධාරීන් මුණ ගැසුණු ජනපති කියා සිටියේ කිසිවෙකු මඟ නොහැර අඩු ආදායම්ලාභීන්ට අවශ්‍ය සහන සලසා දෙන ලෙසය. ජර්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී පීටර් රැම්සෝර් ජනපති මුණ ගැසුණේ බදාදා පෙරවරුවේය.

## නීතියට පිටින් නම් මුකුත්ම බෑ

කොළඹ ට්‍රේස් සිටි හි පැවැති ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති හා පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අවස්ථාවට එක් වෙමින් ජනපති රනිල් අපූරු කතාවක් කළේය. ඒ ඔහුට ලැබී තිබූ ඉල්ලීමක් ගැනය. රුහුණු විශ්වවිද්‍යාලයේ උපකුලපති ඉවත් කරන ලෙස ආචාර්ය සංගම් ඉල්ලා ඇති බව කියූ ඔහු වෘත්තීය සමිති කියනාකාරයෙන් ආණ්ඩුවට කටයුතු කළ නොහැකි බවද කියා සිටියේය. ඔහු සුහද හමුවේදි පවා කියා සිටියේ නීති රීතිවලට පිටින් තමන් කිසිවක් නොකරන බවය.

බදාදා සවස මහජන උපයෝගිතා කොමිසමේ නිලධාරින් මෙන්ම විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් ද පැමිණ සිටියේ විදුලි බිල වැඩිවීම සම්බන්ධයෙන් ජනපති සමඟ සාකච්ඡා කිරීමටය. එහිදි ජනපති ඔවුන්ට උපදෙස් දුන්නේ මහජන උපයෝගිතා කොමිසම විදුලි බිල වැඩි කිරීමට අවසර දී ඇති බැවින් ජනතාවට අඛණ්ඩව විදුලිය සැපයීමට කටයුතු කරන ලෙසයි.

එසේම අඩු ආදායම්ලාභීන්ට සහන සැලසීමටත් පූජනීය ස්ථාන හා රාජ්‍ය ආයතනවලට සූර්ය පැනල සවි කිරීමට සහන දෙන ලෙසත් ජනපති නිලධාරීන්ට දැනුම් දුන්නේය. ආර්ථික කටයුතු හා රටේ මූල්‍ය තත්ත්ව සමාලෝචන රැස්වීම සෑම බ්‍රහස්පතින්දාවකම පැවැත්වෙන්නේ මුදල් අමාත්‍යාංශයේය. ඊට ජනපති ලේකම් සමන් ඒකනායක ද එක් වන්නේය.

## සමන් සර් හරිම සරලයි

ඔහු ජනපති ලේකම් කාර්යාලය පසුපසින් මුදල් අමාත්‍යාංශය වෙත පා ගමනින් එනු දුටුවේ එම අවස්ථාවේ ජනපති මුණ ගැසීමට පැමිණ සිටි රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තකය. ඔහු මුදල් අමාත්‍යාංශයේ පෝටිකෝව අසල රැඳී සිටිමින් ජනපති ලේකම්ගෙන් විමසුවේ "මොකද අද පයින්ම වාහනේ කැඩිලාද?" යනුවෙනි.

"මේ ටික එන්න මොකටද වාහනයක් ගන්නේ. මම පිටිපස්සෙන් එනවා. ඇවිදින එක ඇඟටත් හොඳයිනේ" කියූ ජනපති ලේකම් ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සමඟ මුදල් අමාත්‍යාංශය වෙත පියනැඟුවේය.

ඔවුන්ගේ දෙබස අසා සිටි ආරක්ෂක නිලධාරීන් කතා වූවේ අතීතයේ සිටි නිලධාරීන් දෙස බලන විට වත්මන් ජනපති ලේකම් කොපමණ සරල කෙනෙක්ද යනුවෙනි.

බ්‍රහස්පතින්දා ජනපති හමුවූ මැති ඇමතිවරුන් කිහිප දෙනෙකුම කතා බහ වූවේ මාධ්‍ය වාර්තා කර තිබෙන ඇමරිකානු ප්‍රබල ආරක්ෂක නිලධාරීන් පිරිසකගේ පැමිණීම ගැනය. "ඇමරිකානු සී.අයි.ඒ සංවිධානයේ ප්‍රධානියා ආවා කියලා තමයි කියන්නේ. ඒක ඇත්ත නම් ලංකාවට එහෙම කෙනෙක් ආපු පළමු අවස්ථාව" ඇමති බන්දුල කියද්දී එහි නිලධාරියෙකු කීවේ එහි සත්‍යතාවයක් පවතින බවය.

මේ සියළු කතා සිනාසෙමින් අසා සිටියද ජනපති රනිල් කිසිවක් කීවේ නැත.

ආර්ථිකය ගැන හා විදුලි බිල ගැන කතා කරද්දී ජනපති කීවේ "රටේ ජනතාව විඳින ආර්ථික අපහසුතාවය මට හොඳට තේරෙනවා. ඒත් මේ ප්‍රශ්න හැදුවේ මම නොවෙයි හිටපු ජනාධිපතිතුමා. ඒ නිසා මට රට වෙනුවෙන් ජනප්‍රිය නොවන තීන්දු ගන්න වෙනවා." කියාය.

Mediaman

# බඩගින්න නොදන්නා රටක් බිහිකිරීමේ අභියෝගය



"**කිසිදු පුරවැසියෙක් ආහාර නොමැතිකම නිසා කුසගින්නේ නොතැබිය යුතුය**" මේ පාඨය වත්මන් රජයේ ප්‍රතිපත්තිය වේ. වර්තමානයේ මෙන් රට මුහුණ දෙන බරපතල ආර්ථික අර්බුද සමයන්වලදී, මහා වසංගත තත්වයන්වලදී, හදිසි අපදා තත්වයන්වලදී මෙන් විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ජනතාවට මුහුණ දෙන්න සිදුවන දුෂ්කරතා වචනයෙන් කියා නිම කළ නොහැකි තරම් බරපතල වෙයි. මෙවැනි අවස්ථාවලදී ඔවුන් මුහුණ දෙන විශාලම ගැටළුව වන්නේ ආහාර ලබා ගැනීමේ සහ ඖෂධ ලබා ගැනීමේ දුෂ්කරතාවයයි. පසුගිය කාලය මුළුල්ලේ කොවිඩ් වසංගත තත්වයේදී හා වත්මන් ආර්ථික අර්බුදය හමුවේ මෙලෙස පීඩාවට පත් පිරිස ඉතා ඉහළ අගයක් දක්වා වර්ධනය විය. ආහාර හිඟය නිසා ඇතැමුන් දිවි නසා ගන්නා තැනටද පත්ව තිබූ බවත් වාර්තා විය. මෙවැනි තත්වයන් කලාන්තරයක් තිස්සේ තිබුණ නමුත් ඒ වෙනුවෙන් වන රජයේ සුබසාධන වැඩ පිළිවෙල සාර්ථකව සිදුව තිබුනේ නැත. සමෘද්ධි ආදි සහනාධාර ක්‍රම ගණනාවක් ක්‍රියාත්මක වුණ ද ඒ විධිමත්ව සාධාරණව සිදුව නොතිබිණි. විශේෂයෙන්ම වත්මන් අර්බුද සමය තුළ මේ අඩු පාඩුව කැපී පෙනිනි. මේ වෙනුවෙන් රජයට විධිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාවය පැහැදිලිව පෙන්නුම් කර තිබිණි.

මේ හේතුව මත මේ වෙනුවෙන් නව වැඩපිළිවෙලක් සැකසීම විය යුතු බව ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ වුවමණාව බවට පත්ව තිබිණි. ඒ අනුව ඔහු ජනාධිපති තනතුර බාර ගැනීමත් සමඟ දුන් පොරොන්දුව වූයේ මේ රටේ කිසිවකුත් බඩගින්නේ නොතැබීමට තමන් කටයුතු කරන බවය. ඒ වෙනුවෙන් ප්‍රමුඛතාවය දෙන බවය. " කිසිදු පුරවැසියෙක් ආහාර නොමැතිකම නිසා කුසගින්නේ නොතැබිය යුතුය" යන වත්මන් ප්‍රතිපත්තිය බිහිවන්නේ එසේය. නමුත් ඒ ඒ වෙලාවට සහන මළු ටිකක් බෙදා දී ඔන්න අපි කෙරුවා කියා අත පිහදමා ගැනීමේ ෂේප් න්‍යායෙන් තොරව සෑම කල්හීම මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක් වන ක්‍රමවේදයක් හඳුන්වාදීමට මේ වන විට රජය අවශ්‍ය කටයුතු සිදු කරමින් තිබේ. කිසිදු පුරවැසියෙක් ආහාර නොමැතිකම නිසා කුසගින්නේ නොතැබිය යුතුය යන්න රටේ නීතියක් බවට පත් කිරීම දක්වා මෙම වැඩසටහන පුළුල් කර තිබේ.

ඒ වෙනුවෙන් පවතින නීතිමය ගැටලු සහ බාධා නිරාකරණය කර ගැනීමට අණ පනත් සංශෝධනය කරමින් නෛතික ප්‍රතිපාදන සකස් කිරීමද මෙ වන විට සිදුවෙමින් පවතී.

මේ වන විට සුබසාධක ප්‍රතිලාභ පනතේ කාර්යය හා කර්තව්‍යයන් නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ඉලෙක්ට්‍රොනික වාර්තා සහ ලේඛන සැකසීමට හා ඒ ආශ්‍රිතව තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට හැකි වන පරිදි සුබසාධක ප්‍රතිලාභ පනත සංශෝධනය කිරීමට අදාල පියවර පසුගියදා සිදු කරනු ලැබීය. මේ අනුව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම (ගෙවීම ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) සඳහා නිර්මාණය වන ඩිජිටල් මෘදුකාංගය (App) ක්‍රියාත්මක කිරීමට තිබූ නෛතික බාධාවන් ඉවත් වෙනු ඇත. මෙම මෘදුකාංගය හරහා මෙරට සුබසාධන අවශ්‍ය සියළු පුරවැසියන් හඳුනාගැනීමක් වන අතර ඒ කිසිවකුත් අත් නොහැරෙන සේ අදාල සුබසාධනයන් නිශ්චිත ලෙසම සිදු කිරීමත් සිදුවෙනු ඇත.

ශ්‍රී ලංකාවේ මිලියන 6.3ක ජනතාවකට පවතින ආර්ථික අර්බුදය හමුවේ ආහාර අනාරක්ෂිතතාවයට (Food Insecurity) මුහුණ දිය හැකි බවටත්, ප්‍රමාණවත් ජීවිතාරක්ෂක සහ ජීවනෝපාය ආධාර ලබා නොදුනහොත් ඔවුන්ගේ තත්වය වඩාත් බැරෑරුම් විය හැකි බවත් 'ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ලෝක ආහාර වැඩපිළිවෙල' පසුගිය වසරේ අවසාන භාගයේදී ශ්‍රී ලංකාවට අනතුරු අඟවා තිබුණි. මේ බරපතල තත්වය හමුවේ රටේ සියළුම පවුල් දරිද්‍රතාවයෙන් මුදවාගෙන ආහාර සුරක්ෂිතතාවය තහවුරු කොට මන්දපෝෂණ තත්වයෙන් දරුවන් මුදවා ගැනීම සඳහා කඩිනම් ජාතික බහු-ආංශික ඒකාබද්ධ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහනක් කිරීමට රජය විසින් පියවර ගනු ලැබීය. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ නිලධාරීන් ඇතුළත් වන පරිදි සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය මෙන්ම පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තිකයන්, ආගමික නායකයින්, දේශපාලනඥයින් යන පුද්ගලයින් ඇතුළත් වන සේ මෙම බහු - ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් ද හඳුන්වා දෙනු ලැබීය.

මෙහිදී ගෙයින් ගෙට ගොස් දත්ත එක් රැස් කර දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා විවිධ තාක්ෂණික පාර්ශ්වයන්ගේ සහයෝගය ද ඇතිව මෘදුකාංගයකය නිර්මාණය කර ඇත. මෙම සියලු තොරතුරු දත්ත මෙහෙයුම් මධ්‍යස්ථානයක් (Data Operation Center) හරහා එකතු කෙරේ. ආහාර නිෂ්පාදනය, ආහාර ලබා ගැනීමේ ගැටලු, මන්දපෝෂණ තත්වය පිළිබඳව මෙන්ම ප්‍රතිලාභ ලැබිය යුතු තැනැත්තන් හඳුනාගැනීම හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලේඛනයක් නිර්මාණය කිරීම මෙහි අවසානයේදී සිදු කිරීමට අපේක්ෂිතය. දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි මෙම දත්ත සංගණනය සිදු කෙරෙන අතර දැනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23ක පමණ සංගණන කටයුතු අවසන් කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවේ ද සහාය ඒ සඳහා ලැබී තිබේ. කෙසේ නමුත් මෙම වැඩසටහන විධිමත්ව ක්‍රියාත්මකවීම මාර්තු මස අවසානය වන විට සිදුවෙතැයි අපේක්ෂා කරන මුත් එතෙක් ප්‍රතිලාභ අවශ්‍ය අය ලෙස හඳුනාගෙන සිටින පිරිස් වෙත එම සහන ලබාදීම අඛණ්ඩව සිදුවෙමින් පවතී.

මේ අතර "සෑම පුරවැසියෙකුටම රටෙහි පවතින ඕනෑම තත්වයකදී වුවද ක්‍රියාශීලී නිරෝගී දිවිපැවැත්මකට අවශ්‍ය ප්‍රමාණවත් ආහාර සාධාරණ මිළකට ලබැගැනීමට හැකිවීම" යන දැක්ම මුල් කරගෙන රජයේ ආහාර සුරක්ෂිතතා වැඩසටහන ක්‍රියාත්මක වේ. කිසිදු දරුවෙකු මන්දපෝෂණ තත්වයට ගොදුරු නොවිය යුතුයි යන රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ රජය කඩිනම් ව්‍යාපෘති ගණනාවක් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරමින් තිබේ. ආහාර සුරක්ෂිතතා වැඩසටහන යටතේ සමෘද්ධිලාභී පවුල් සහ හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් වෙත මාසික මූල්‍ය දීමනා සහ ආහාරමය දීමනාවක් අඛණ්ඩව ලබාදීමටත් ජනාධිපතිවරයා උපදෙස් ලබා දී තිබේ.

> **එමෙන්ම අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 20කට මාසයකට සහල් කිලෝ ග්‍රෑම් 10 බැගින් මාස දෙකක් නොමිලේ සහල් ලබාදීමේ වැඩසටහන යටතේ වී මෙට්‍රික් ටොන් 61,600ක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීමට මීට පෙර තීරණය කර තිබිණි. නමුත් පසුව අනාවරණය වූයේ මෙම වැඩසටහන සඳහා පවුල් විසිඅට ලක්ෂ පනස් දහසක් හඳුනා ගෙන ඇති බවයි. අඩු ආදායම්ලාභී සියලුදෙනා වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ද තීරණය විය. ඒ අනුව පවුල් විසිඅට ලක්ෂ පනස් දහසක් (2,850,000) සඳහා මාර්තු, අප්‍රේල් මාසවල දී සහල් ලබාදීම වෙනුවෙන් ප්‍රමාණවත් වී තොග මිලදී ගැනීමට පසුගියදා තීරණය කෙරුණු අතර එම මිලදී ගැනීම් රුපියල් බිලියන 20ක් වෙන් කිරීමට ද ජනාධිපති රනිල් වික්‍රමසිංහ අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙනු ලැබීය.**

එමෙන්ම අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 20කට මාසයකට සහල් කිලෝ ග්‍රෑම් 10 බැගින් මාස දෙකක් නොමිලේ සහල් ලබාදීමේ වැඩසටහන යටතේ වී මෙට්‍රික් ටොන් 61,600ක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීමට මීට පෙර තීරණය කර තිබිණි. නමුත් පසුව අනාවරණය වූයේ මෙම වැඩසටහන සඳහා පවුල් විසිඅට ලක්ෂ පනස් දහසක් හඳුනා ගෙන ඇති බවයි. අඩු ආදායම්ලාභී සියලුදෙනා වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ද තීරණය විය. ඒ අනුව පවුල් විසිඅට ලක්ෂ පනස් දහසක් (2,850,000) සඳහා මාර්තු, අප්‍රේල් මාසවල දී සහල් ලබාදීම වෙනුවෙන් ප්‍රමාණවත් වී තොග මිලදී ගැනීමට පසුගියදා තීරණය කෙරුණු අතර එම මිලදී ගැනීම් රුපියල් බිලියන 20ක් වෙන් කිරීමට ද ජනාධිපති රනිල් වික්‍රමසිංහ අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙනු ලැබීය. මෙහිදී ගොවි ජනතාවගෙන් කිලෝව රුපියල් 100 ගණනේ වී මිලදී ගැනීමට තීරණය කළ අතර එමඟින් ගොවි ජනතාවටද ආර්ථික සුරක්ෂිතතාවයක් ගැටලුවකින් තොරව හිමිව තිබේ. මේ අතර එම සහතික මිලට වී මිලදී ගැනීමට මහා පරිමාණ සහල් මෝල් හිමියන්ද පසුගියදා ජනාධිපතිවරයා හමුවේ පොරොන්දු වී තිබිණි.

එසේම මේ අනුව දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි සුදුසුකම් ලැබූ අයට සහල් බෙදාහැරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ඔස්සේ සිදු කළ යුතු වනවා සේම එය විනිවිදභාවයකින් යුක්තව කළ යුතු කාර්යයකි. එනිසා මෙවන් වැඩසටහන් ඉදිරියට ගෙන යාම සඳහා නිවැරදි දත්ත ලබා ගැනීම ඉතා වැදගත් වේ. ඒ සඳහා සියලු පුරවැසියන්ගේත් සහයෝගයද අත්‍යවශ්‍ය කාරණයකි.

මේ වන විට ආර්ථික අර්බුදය නිසා අවදානමට ලක්ව සිටින පිරිස් වෙත සහන ලබාදීමේ තවත් වැඩසටහන් ගණනාවක්ම රජයේ ඉල්ලීම මත ලෝක ආහාර වැඩසටහන සහ තවත් ජාත්‍යන්තර සංවිධාන විසින් ක්‍රියාත්මක කරමින් සිටී. රට මුහුණ දී තිබෙන මානුෂික අර්බුදය හමුවේ ජනාධිපතිවරයා ජත්‍යන්තර ප්‍රජාවෙන් කළ ඉල්ලීම් අනුව හෝ මේ සහය ලැබීම මේ මොහොතේ අතිශය වැදගත්ය. මිළ උද්ධමනය සහ ආහාර උද්ධමනය ඉහළ අගයක් ගන්නා මෙවන් අවස්ථාවක ආහාරවල මිල ගණන් තවදුරටත් ඉහළ යාම හේතුවෙන් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම රජයේ වගකීමක් වනු ඇත. විරැකියාව වැඩිවීම සහ ගෘහස්ථ ආදායමට එල්ල වී ඇති විශාල බලපෑම මඟින් අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමත් අභියෝගයක්ව පවතින අවස්ථාවක එම වගකීම රජය අවශ්‍ය බරින් ගෙන තිබෙන බව මේ වන විට ක්‍රියාත්මක පියවර පැහැදිලිය.

මෙම ආර්ථික අර්බුදය ලංකාවට පමණක් බලපාන තත්වයක් නොවේ. මෙය ලෝක මට්ටමෙන් පවතින අර්බුදයකි. මෙවන් අර්බුදයක් හමුවේ අත්‍යවශ්‍ය ආහාර නිෂ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ සමස්ත යාන්ත්‍රණය කෙරෙහි මග පෙන්වීම හා අධීක්ෂණය කිරීම මෙන්ම, විවිධ පරිපාලන මට්ටම්වලදී සමාජය තුළ වඩාත්ම අවදානමට ලක්විය හැකි පිරිස් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව රාජ්‍ය යාන්ත්‍රණය හරහා සිදු වෙමින් පවතී. "ආහාර ප්‍රතිපත්ති කමිටුව" ස්ථාපිත කිරීමද මෙහි එක් පියවරක් ලෙස ක්‍රියාත්මක වේ.

මේ අතර පාසල් 7,926ක සිසුන් මිලියන 1.08ක් ඉලක්ක කර ගනිමින් වාර්ෂිකව රුපියල් බිලියන 4ක පමණ වියදමකින් පාසල් දිවා ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම ද රජයේ අපේක්ෂාව වේ. පාසල් දරුවන් යනු රටේ අනාගතයයි. ඔවුන් අනාගතයේ දී නිරෝගී සෞඛ්‍ය සම්පන්න මිනිසුන් ලෙස ශ්‍රම බලකායට එක්වීමට නම් මෙම අර්බුද අවස්ථාවේ දී ඔවුන්ගේ සුබසාධනය සැපයීමට ප්‍රමුඛතාවය දිය යුතුය. එමෙන්ම සමස්තයක් වශයෙන් නීරෝගි ජනතාවක් බිහිකිරීම අරමුණ ඇතිව පුරවැසියන්ට සෞඛ්‍යය සම්පන්න ආහාර පරිභෝජනය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසිය යුතුය. ඒ අනුව ආරක්ෂිත ආහාරමය පරිසරයක් පැවතීම ඇතුළුව පෝෂණ තත්වය යහපත්ව පවත්වාගෙන යාම කෙරෙහි බලපාන විවිධාකාර වූ ගැටලුවලට සාර්ථකව විසඳුම් ලබා දීම වෙනුවෙන් "ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 2021 - 2030" ක්‍රියාත්මකවීමට ද නියමිතය.

ඒ අනුව ආර්ථික අර්බුදයෙන් බලපෑමට ලක්වී සිටින සහනාධාර අවැසි ජනතාවට රජය විවිධාකාරයේ සුබසාධක වැඩසටහන් මේ වන විට ක්‍රියාත්මක කරමින් තිබේ. විශේෂයෙන් සමෘද්ධි ප්‍රතිලාබ මුදල වැඩි කිරීමද සිදුව තිබිණි. ඊට අමතරව ගර්භණී මාතාවන්ට දෙන මාසික පෝෂණ දීමනාව, වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගී දීමනාව ද ඇතුළත් වේ. මේ අනුව අනාගත සමෘද්ධිමත් ශ්‍රී ලංකාව ගොඩනැඟීම වස් ඇවැසි නිරෝගී ජනතාවක් බිහිකර ගැනීමේ පදනම ද මේ වන විට ගොඩනගා අවසන්ය. කොහොම නමුත් ප්‍රතිපත්තියක්, සැලසුමක්, අනාගත ඉලක්කයක් සහිතව නිවැරදිව දුරදක්නා දැක්මක් සහිත නායකත්වයක් රටට අවශ්‍ය අවස්ථාවේ ලැබී තිබීම මේ සියල්ල පිටුපස ඇති රහසය.

තරුවි ඉරුගල්බණ්ඩාර

# දම් පාට නරියන්ට SORRY!



නරි රජ වුණේ නිල් හැළියේ ඔළුව එබුණු නිසාය. කැලේ සත්තු නරියව රජ කළේ නිල් පැහැ ඔළුවක් ඇති, මේ නම් වෙනස්ම සතෙක් කියා හිතලාය. නමුත් පැහැයට රැවටී රජ කළේ නරියෙක් බව සත්තු තේරුම් ගන්න හඳ පායනම තුරු ඉන්න සිදුවිය. එයත් සත්තු දැනගත්තේ හඳ දැකපු නරියට රජකම අමතකව ජන්ම ගතිය ඉස්සරහට පැමිණි නිසාය.

නිල් හැළියේ ඔලුව ඔබාගත් නිසා රජකම ලබාගත්, ඒත් හඳ දැකපු ගමන් සියල්ල අහිමි කරගත් ඒ ජන කතාව අපට සිහිපත් වූයේ නිකංම නොවේය. ඒ ජනතා විමුක්ති පෙරමුණ ලෙස පැවති රතු පැහැය ඉවත්කර ජාතික ජන බලවේගය ලෙස දම් පැහැය තවරාගත් උදවියත් දැන් නිල් හට්ටියේ ඔලුව ඔබාගත් නරියාට ඇඳ සිටින බවක් පෙනෙන්නට ඇති නිසාය. සමහර තැන්වල හඳ දැකලාදෝ කියා හිතෙන අන්දමටත් හැසිරෙන්න ගෙන ඇති නිසාය.

හංගා ගහන්න දෙයක් නැත. පසුගිය කාල වකවානුව තුළ ජවිපෙ රතු පැහැය අත්හැර දම් පාට තවරා ගැනීම හරහා යම් ජනතා ආකර්ෂණයක් අත්කරගෙන තිබුණු බව ඇත්තය. ජවිපෙ රතු පැහැය පමණක් නොව, ජවිපෙ කාඩර් සංස්කෘතිය වූ, පොඩි වුණු කමිස, කිළුටු ඩෙනිම්, වවපු කොණ්ඩ රැවුල් ද ජාජබ තුළ දකින්න ලැබුණේ නැත. රතු පොත්, කාල් මාක්ස්, ලෙනින්, එංගල්ස් වේදිකාවෙන් හීනියට ඉවත්කර තිබුණු අතර, ජාජබ හැඩය මුළුමනින්ම ලිබරල් දේශපාලන පක්ෂයක හැඩය ගෙන තිබිණ. ටයිකෝට් සහිත ෆුල්සූට් මහත්වරුන් වේදිකාවට නංවා රතු කාඩර්වරුන් සංවිධාන වැඩවලට ගැට ගසා තිබිණ. විට හප පිරුණු රතු කාඩර්වරුන් වෙනුවට ස්මාර්ට් පිංක් වෘත්තිකයන් වෙත යම් ආකාරයක තරුණ ආකර්ෂණයක් ගෙන තිබිණ. වෙනදා කථිකයා, සංවිධායකවරයා සහ ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දෙනු ලැබූ පුද්ගලයා පමණක් සිටි ජවිපෙ ගැලරියට සෙනග ඇදුණේ ඒ තුළය.

සෙනග සමඟ ජවිපෙට මෙරට ව්‍යාපාරික ප්‍රජාවේ ද අවධානය යොමුවිය. සල්ලි ද පැමිණියේය. ඒ රැල්ල ගැන කෝටිපති ව්‍යාපාරික දිලිත් ජයවීර ප්‍රසිද්ධියේ කිව්වේ ජවිපෙ යනු තවදුරටත් දේශපාලන පක්ෂයක් නොව, බිලියන ගණනක් මුදල් ඇති ව්‍යාපාරයක් බවය. දිලිත්ගේ ඒ කතාව මේ වන විට සජබ වේදිකාවේ ජවිපෙට එරෙහි කථිකයා ලෙස පත් කරගෙන සිටින සුජීව දන්නේ නැත. ඒ නිසා සුජී තවමත් වේදිකාවේ සිට කෑමොර දෙන්නේ, **"හඳුන්නෙත්තිට කඩයක් දාලා දෙන්න - පුළුවන් නම් කඩේ කරලා පෙන්නන්න"** කියමින්ය. නමුත් දැන් ජවිපෙ ඉන්නේ, සුජීටත් සුපර් මාර්කට් එකක් ලබාදිය හැකි තැනකය.

ඒ බව පසුගියදා ජවිපෙ හිටපු මන්ත්‍රීවරයකු වන නලින්ද ජයතිස්ස තහවුරු කර සිටියේ ප්‍රසිද්ධ රූපවාහිනී විවාදයකදීය. එහිදී නලින්ද දැක්වූ අදහස් අනුව නම් මිනුවන්ගොඩ පැවැත්වූ දේශපාලන රැස්වීමක් සඳහා ජවිපෙ වියදම රුපියල් ලක්ෂ 10ක් 12ක් ය. රැස්වීම පැවැත්වූයේ මිනුවන්ගොඩ නගර සභාව ඉලක්ක කර ගෙනය. එහි ඇති ඡන්ද ප්‍රමාණය 7,000ක් ය. ඡන්දය වෙනුවෙන් එක් පක්ෂයක් වියදම් කිරීමට හැකියාව ඇත්තේ රුපියල් 60ක් පමණය. ඒ අනුව නම් මිනුවන්ගොඩ රැස්වීමේ වියදම රුපියල් ලක්ෂ 4.2ක් මිස ඊට වැඩි විය නොහැකිය. ඊට වැඩිපුර වියදම් කිරීම නීති විරෝධීය.

නමුත් ප්‍රශ්නය ඇත්තේ නලින්ද ඒ ගැන කිසිම තක්සේරුවක් නොමැතිව අදහස් දැක්වීමය. නැතිනම් නලින්දට රටේ මූලික නීතිය ගැන තැකීමක් නැති බවය. නැති නම් එය අමතකව ඇති බවය. මේ තත්වය නලින්දගේ හුදකළා අතපසුවීමක් ලෙස කිසිසේත් සැලකිය නොහැකිය. මේ අන් කිසිවක් නොව, පාට මාරු කර සෙනග අද්දවා ගත්තත් ජවිපෙ ජන්ම ලක්ෂණ මතුවීමය. ඔවුන්ට බලය ගැනීම සඳහා වන කටයුත්තේදී වඩාත් විශ්වසනීය ප්‍රචණ්ඩත්වය වන අතර රටේ මූලික නීතිය ගැන කොහෙත්ම සැළකිල්ලක් නැත.

ඒ ගැන තවත් උදාහරණත් ඕන තරම්ය. ඊට ආසන්න සිදුවීම නම්, පසුගිය දිනවල විශ්වවිද්‍යාල තුළ ඇතිවූ ගැටුම්ය. පොලිස් වාර්තා අනුව මෙසේ ගැටී ඇත්තේ ජවිපෙට සහ පෙසපට සහය දක්වන දෙපාර්ශ්වයය. ගැටුමේ හේතුව අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ බලය තහවුරු කර ගැනීමය.

අන්තරේ කියන්නේ ජවිපෙ සිය ශිෂ්‍ය දේශපාලන කටයුතු වෙනුවෙන් සංවිධානය කළ බහුජන ව්‍යාපාරයය. ජවිපෙ කාඩර්වරුන් රැසක තිඹිරි ගෙය මෙතැනය. විශ්වවිද්‍යාල පද්ධතියම කාලයක් ජවිපෙ පාලනය කළේ මේ අන්තරේ බලය තහවුරු කරගෙනය. නමුත් ජවිපෙ පාර්ශ්වයක් පෙසප ලෙස බෙදී වෙන්වූ අවස්ථාවේ අන්තරේ බලය පෙසප සතු විය. අදටත් පෙසප සතු සංකේතාත්මක දේශපාලන අවිය අන්තරේය. පසුගිය අරගල සමයේ, රටේ නීතිය ව්‍යවස්ථාව නොව අරගලය විසින් ක්‍රියාත්මක කරන බවට පෙසප නායකයා කිව්වේ, අන්තරේ යන්තරේ තමන් සතුව තිබූ නිසාය.

කෙසේ හෝ වේවා දැන් ජවිපෙ, පෙසප හැපෙන්නේ මේ අන්තරේ යන්තරේ තමන් සතු කර ගන්නටය. ඒ කොහෙත්ම මතවාදී ගැටුමක් හෝ අවම ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට නොව අන්තිම ම්ලේච්ඡ ෆැසිස්ට් උමතුවක් ලෙසය. ඒ ගැන ජපුරේ මෙන්ම සබරගමුවේ ගැටුම්වලදී ප්‍රතිවාදී සිසුන්ට පහරදෙන්න යොදාගත් ගල්, මුගුරු යකඩ පොලු සාක්ෂි දරණු ඇත. පාට මාරු කර රට හදන්න, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කිඹුල් කඳුළු හෙළන මේ නඩය බලයට සමීප වූ විට හැසිරෙන්නේ එහෙමය.

ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලදී පමණක් නොව, දැන් පාට මාරු කිරීමට ඇදපු සෙනග දැක බලය ගන්න ඔන්න මෙන්න සිතා ඉන්න ජවිපෙ නායකයන් කාගේ කාගේත් හැසිරීම එහෙමය.

**"සියලු සමීක්ෂණ වාර්තාවල තියෙන්නේ මාලිමාව උඩින්. මුද්‍රණාලයේ ප්‍රධානියාට අපි කියන්නේ... තමන්ගේ වගකීම් පැහැර හැරීම පිළිබඳව... හිතා මතා ඡන්ද වැළැක්වීම සඳහා බාධා කළොත් නඩු අහලා අවුරුදු 03ක් හිරේ. හොඳට මතක තියාගන්න කවුරු ඔය නඩු ඇහුවේ නැතත් අපි අහනවා"**

**"භාණ්ඩාගාර ලේකම් සිරිවර්ධන මහත්තයා සල්ලි වියදම් කරන්න කටයුතු කරන්නේ නැත්තම්... ඔබ අධිකරණය ඉදිරියේ වගඋත්තරකරුවෙකු බවට පත් කරන එක සහතිකයි. ඒ වගේම ජනාධිපති ලේකම්වරයා. නඩුවක් එනවා... ඔබතුමා විත්තිකූඩුවට නගින... මම සාක්ෂි කූඩුවට නගින. මහජනයාගේ මතයත් එක්ක මෙහෙම සෙල්ලම් කරන්න බැහැ. ඡන්දෙ දෙන්නේ නැත්තම් අපි ලෑස්තියි ලක්ෂ සංඛ්‍යාත ජනතාව පාරට ගෙනල්ලා... පාරේ විසඳ ගන්න"**

මේ හඬ ජවිපෙ නායක අනුරගේය. එහි කොතැනවත් අධිකරණ ක්‍රියාවලියක්, යුක්තිය පසිඳලීම වෙනුවෙන් කැපවීමක් ගැන කියවෙන්නේම නැත. ඒ තුළ ඇත්තේ තර්ජනයක් පමණය. ඒ තර්ජනය

> **ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් කියන්නේ, තමන්ගේ පාලනයක රාජ්‍ය බදු ආදායම, රජයේ ප්‍රධාන ආදායම් මාර්ග යක් නොකරගන්නා බවය. ඒ කියන්නේ රජය ව්‍යාපාර සිදුකරන බව නොවේද? රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් මැදිහත්වනවා පමණක් නොව, බදු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් නොවනවා නම්, රාජ්‍ය ව්‍යාපාර ඉහළ ලාබ ජනිත කරන තැනට පත් කරන්නට සිදුවීම අනිවාර්යයක්ය. නැත්නම් රජයේ මූලික වියදම් පවා දරන්නට රජයට මුදල් කොයින්ද? එසේ නම් පෞද්ගලික ව්‍යාපාරවලට තර්ජනයක් සිදුවන ආකාරයට රාජ්‍ය ව්‍යාපාර මෙහෙයවීමක් තුළ මිස වෙනත් ආදායම් ඉපයීමක් ගැන නම් ටිල්වින්ගේ කතාවෙන් අදහස් වෙන්නේ නැත. න්‍යාය අනුව නම් ටිල්වින් ඉන්නේ, රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයක් රටේ ස්ථාපිත කරන්නටය.**

වෙනුවෙන්ද ලංසු තබා ඇත්තේ "මහජන මතය" යන්නය. මහජන මතය පෙරමුණේ තබා මේ තර්ජනය කරන්නේ පළාත් පාලන මැතිවරණය කෙසේ හෝ පවත්වන්න කියාය.

ප්‍රශ්නය ඇත්තේ මේ මොහොතේ රටේ මහජනතාව ඡන්දයක් ඉල්ලා නොසිටීමය. ගෝඨාභය ගෙදර යැවීමට පාරට බැස්ස ලක්ෂ සංඛ්‍යාත මහ ජනතාව ඉල්ලුවේ, ආර්ථික අර්බුදය විසඳන ලෙසය. ඉන්ධන, ගෑස්, ආහාර පෝලිම් අවසන් කර රට යථා තත්වයට පත්කරන ලෙසය. ඒ හැර කවුරුත් ඡන්දයක් ඉල්ලුවේ නැත. ඒ නිසා මේ මොහොතේ පාට මාරු කරගත් දේශපාලන පක්ෂ සෙනග ඉස්සරහා තබාගෙන එල්ල කරන තර්ජනවලට බිය විය යුතුද නැත. මන්ද සෙනග සහ මහජනතාව කියන්නේ එකක් වගේ පෙනුණත්, මුළුමනින්ම වෙනස් දේශපාලන අන්තර්ගතයන් නිසාය. සෙනග නම් බස් නැවතුම්වල, දුම්රියේ, සංගීත සංදර්ශනවලද ඇත. නමුත් මහජනතාව කියන්නේ තීරණාත්මක මොහොත එළඹී විට දේශපාලනිකව සක්‍රීය වන පිරිසය. ඔවුන් ප්‍රමාණයෙන් වැඩි අතර, මේ මොහොතේ ඔවුන් නිහඬය. ඒ කියන්නේ සෙනග ගැවසුනාට, එය රැල්ලක් ලෙස දැක්කාට සැබෑ මහජනතාව මේ මොහොතේ බහුතරය ලෙස නිහඬව සිටින බවය. ඒ විය යුතු දේ වෙමින් තිබෙන නිසාය. එනම් ආර්ථික අර්බුදයෙන් රට ගොඩ නැගීමේ කටයුත්ත නිශ්චිත ජනාධිපති රනිල් සිදුකරන ආකාරය සම්බන්ධයෙන් ඔවුන් නිරීක්ෂණ කාර්යයක් සිදුකරන බවය.

මේ ගැන කවුරු සංවේදී නොවුණත් උපන් ගෙයි දේශපාලන පරාජිතයන් වන ජවිපෙ සංවේදීය. අන්න ඒ නිසා ඔවුන් මේ සූදානම් වන්නේ, සෙනග ගැලරියෙන් බැස යන්නට පෙර පළාත් පාලන ආයතන ටිකවත් පුරවා ගන්නටය. වෙනදා සූරාකෑම, කොල්ලකාරී ධනවාදය, පොදු දේපල ක්‍රමය ගැන නන්දෙඩවූ ජවිපෙ අද සිය තානම මාරු කර ඇත්තේ ඒ සඳහාය. නමුත් ප්‍රශ්නය ඇත්තේ පාට මාරු කලාට සිය ඓතිහාසික වැරදි ප්‍රතිපත්ති සකස් කරගන්නට ජවිපෙ කටයුතු කර ගෙන ඇතිද යන්නය. ජවිපෙ පාට මාරුවට ඇන්ද සෙනග පවා මේ ගැන නොසිතුවොත් ඔවුන්ට සිදුවන්නේද තාප්ප පිරෙන්න චිත්‍ර ඇඳ සිස්ටම් වෙනස් කරන්න ගිය උදවියට සිදුවූ දේ මය.

අප එසේ කියන්නේද හේතු ඇතුවය. වඩාත් තීරණාත්මක කරුණක් වන්නේ පාට මාරු කළ ජවිපෙ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් දක්වන අදහස් සම්බන්ධයෙන් පවා ජවිපෙ ඉහළ නායකත්වයන් දරණ මතවල පරස්පරතා පැවතීමය. නිදසුනක් ලෙස ගතගොත්, ජවිපෙ නායකයා ව්‍යාපාරික හමුවලදී අවධාරණය කරන්නේ, අනාගත ජවිපෙ ආණ්ඩුවක රාජ්‍යය ව්‍යාපාරික කටයුතු කෙරෙහි මැදිහත් නොවන බවත්, මූල්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පමණක් මැදිහත්වීම් සිදුකරන බවය. නමුත් ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් කියන්නේ, තමන්ගේ පාලනයක රාජ්‍ය බදු ආදායම, රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් නොකරග න්නා බවය. ඒ කියන්නේ රජය ව්‍යාපාර සිදුකරන බව නොවේද? රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් මැදිහත්වනවා පමණක් නොව, බදු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මාර්ග යක් නොවනවා නම්, රාජ්‍ය ව්‍යාපාර ඉහළ ලාබ ජනිත කරන තැනට පත් කරන්නට සිදුවීම අනිවාර්යයක්ය. නැත්නම් රජයේ මූලික වියදම් පවා දරන්නට රජයට මුදල් කොයින්ද? එසේ නම් පෞද්ගලික ව්‍යාපාරවලට තර්ජනයක් සිදුවන ආකාරයට රාජ්‍ය ව්‍යාපාර මෙහෙයවීමක් තුළ මිස වෙනත් ආදායම් ඉපයීමක් ගැන නම් ටිල්වින්ගේ කතාවෙන් අදහස් වෙන්නේ නැත. න්‍යාය අනුව නම් ටිල්වින් ඉන්නේ, රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයක් රටේ ස්ථාපිත කරන්නටය. එවැනි කාලයක් 71දී සිරිමා පාලනය තුළත් සිදුවූ අතර ගෝඨාභය පාලනයට පෙර අපේ රටේ මිනිස්සු පෝලිම් යුගයක් අත්දැක තිබුණේ නම්, ඒ සිරිමාගේ මේ රාජ්‍ය ඒකාධිකාරී ආර්ථික මොඩලය ඇතුළේය.

ජවිපෙ පාට මාරු කරගෙන සෙනග ඇද්ද ගත්තාට ප්‍රතිපත්ති ගැන සංවාදය තුළ නම් ඉන්නේ ඔන්න ඔය වැනි භයානක තැනකය. මේ ආකාරයට හෝ ජවිපෙ මේ දෙබිඩි අතාර්කික සහ යල්පැන ගිය විසඳුම් විගඩම් එළියට පනින්නේ රට දරුණුතම ආර්ථික අර්බුදයකට මුහුණදී මහජනතාව විසඳුම් අපේක්ෂාවෙන් සිටින නිසාය. ඒ නිසා තීරණාත්මක ප්‍රශ්න හමුවේ ප්‍රතිපත්තිය එළියට දැමීමට ජවිපෙට සිදුව ඇත. එක් පැත්තකින් එසේ අමාරුවේ වැටෙන ජවිපෙ, අනෙක් පැත්තෙන් තවත් අමාරුවක වැටී ඇත. ඒ මේ වන විට සිය පළාත් පාලන නියෝජිතයන් ගැන ජවිපෙ කියූ සුරංගනා කතාද නින්දා සහගත ලෙස අනාවරණය වෙමින් ඇති නිසාය. කොටින්ම කිව්වොත් මිනිස් ඝාතනවල චූදිතයන් පවා මෙවර මාලිමාවෙන් ඉදිරිපත් කර ඇති අතර, හොරුන්, මංපහරන්නන් මෙන්ම, දූෂණ චෝදනා ඇති පිරිස් රැසක් මාලිමාවේ රැල්ලට ගොඩවී ඇත. ගෝඨා ස' වෙනුවෙන් මරාගෙන මැරෙන්න ගිය බිම් මට්ටමේ පොහොට්ටු පවා ඒ රැල්ලේ පැමිණ ඇත.

ඇත්තටම කඩිනම් ඡන්දයක් ඉල්ලා මරාගෙන මැරෙන තැනට ජවිපෙ පැමිණ ඇත්තේද මේ නිසාය. මැතිවරණය පමා වෙන්න පමා වෙන්න ජවිපෙ සායම හේදෙන අතර ඔය අස්සේ හඳත් පෑව්වොත් පාට මාරු කළ ජවිපෙට වෙන්නෙත් නිල් සායමින් රජවූ නරියට සිදුවූ දෙයම නොවේද?

කල්ප අනුත්තර ලියනගේ

CHATHAM STREET JOURNAL



# රාජ්‍ය සේවය සුද්ද කරන පෙරළියක්



කක්කුටු බෙන වහන්නෙ නැතුව වක්කඩ බැඳලා වැඩක් නැහැ. ඒ කියන්නේ පොඩි පොඩි වැරදි ටික නිවැරදි නොකර ලොකු වැරදි හදන්න යෑමෙන් වැඩක් නොවෙන බවය. මන්ද පසුව මේ පොඩි පොඩි වැරදි ලොකු වැරදි බවට පත්වෙනවා කියන එකය. ලංකාවේ දේශපාලනයේ නිතර ඇසෙන කතාවක් වී ඇත්තේ රාජ්‍යයේ නාස්තිය වංචා දූෂණ ආදිය නැති කිරීම වෙනුවෙන් ඒවාට වගකිව යුතු දේශපාලකයන් අල්ලා හිරේ දමනා බවය. හොරකම් කළ සල්ලි ආපහු ගන්න අරගෙන රටේ ආර්ථික අර්බුදය විසඳන බවය. මෙහෙම කරන්න පොරොන්දු වෙන්නේම ලොකු ලොකු වැඩය. වේදිකා දෙවනත් කරගෙන මේ කතා කියන අය කියන්නෙම අපිට රට බාර දුන්නොත් මාස හයෙන්, අවුරුද්දෙන් මේ වැඩේ කරලා රට ගොඩ දමන බවය. මේවා කියන්න ලෙහෙසිය. නමුත් කරන්න ලෙහෙසි නැත. අඩුම තරමින් මේ කියන කතන්දරවල සාධාරණත්වය ගැන, පදනම ගැන අදහසක්ද නැත. අඩු තරමින් මේවා කරන්න රටේ නීතියක්වත් තිබෙනවාද නැද්ද යන්න ගැනවත් අදහසක් නැත.

කොහොම නමුත් රාජ්‍ය සේවය නැති නම් රාජ්‍ය යාන්ත්‍රණයම රටට බරක් වී ඇති බව අද සෑම සියලු දෙනාම පිළිගන්නා සත්‍යයකි. ඒ අත්දැකීමෙන්ම විඳගෙන දන්නා දෙයකි. රජයේ වියදම් අධිකය. ආදායම් අඩුය. ආකාර්යක්ෂමතාවය, නාස්තිය, දූෂණය, වංචාව රාජ්‍ය සේවය හා ආත්මීයව බැඳී තිබෙන තරම් සමීපය. මේ තත්වයන් හා රටේ රාජ්‍ය යන්ත්‍රණයේ විශාලත්වය අනුව රට බංකොලොත්වීමට එය හොඳටම ප්‍රමාණවත්ය.

එහෙත් මේ ජරාජීර්ණ තත්වයන් වෙනස් කිරීමට යෝජනා කරන වුන් ඒ වෙනුවෙන් ගන්නා පියවර මොනවාද? යාන්ත්‍රණය කාර්යක්ෂම කරන්නේ ඔළුව අතගා හුරතල් කරලාද? බලහත්කාරයෙන්ද? රාජ්‍ය සේවය කප්පාදු කර අඩු පිරිසකට වැඩි වැඩ ගොඩක් පැටවීමෙන්ද? රාජ්‍ය යාන්ත්‍රණයෙන් රාජ්‍ය ආදායම ඉහළ දමන්න පුළුවන්ද? අලුත් රාජ්‍ය ව්‍යාපාර ආරම්භ කරනවාද? අධික වියදම් කපා හරින්නේ නාස්තිය අවසන් කරන්නේ කොහොමද? අකටයුතුකම්, වැරදිවලට වගකිව යුතු අය අල්ලා නීතිය ක්‍රියාත්මක කිරීමෙන්ද? අලුතෙන් නීති රීති දමා හොරු අල්ලන්න පුළුවන්ද? අලුත් පාලකයන් පත් කරලාද? මේක මාස 6න් නැතිනම් අවුරුද්දෙන් කරන්න පුලුවන්ද? මේ පවතින රාජ්‍ය සේවා ක්‍රමවේදය තුළ එහෙම කරන්න ඉඩක් අවස්ථාවක් ලැබෙයිද? මේ තත්වයන් ඇතිවීමට වගකිව යුත්තේ ආණ්ඩු කරපු පාලකයන් කියා පාලකයන් පන්නා දමා අලුත් පාලකයන් පත් කරගැනීමෙන් මේ ගැටලු විසඳිය හැකිද? මේ ආදී ප්‍රශ්න ගණනාවක් පැන නැඟීම මෙහිදී සිදුවෙයි.

මෙරට මෑත කාලීන අත්දැකීම් අනුව මේ කිසිවක් සිදු කිරීම කළ නොහැකි බවත් අත්දැකීමෙන්ම මෙරට ජනතාවට අවබෝධයක් තිබේ. රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණයක් ගැන කතා කරනකොටම ඒවට එරෙහිව රාජ්‍ය සේවයෙහි වෘත්තිකයන්ගේ උද්ඝෝෂණ විරෝධතා වැඩවැරුම් ඇතිවීම සිදුවෙයි. ඉතාම ආසන්න උදාහරණයක් ඊයේ පෙරේදා දකින්නට තිබිණි. ඒ පසුගිය 13 වනදා සිදු වූ දුම්රිය සේවකයන්ගේ වැඩවැරුමය. ඊට හේතුව දුම්රිය සේවකයන් සේවයට වාර්ථා කිරීමේ කාලය සටහන් කිරීමට ඇඟිලි සළකුණු යන්ත්‍රය යොදා ගැනීමට ගත් තීරණයත්, නීති රීති උල්ලංඝණය කරමින් කටයුතු කරන සේවකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් පාලනාධිකාරිය ගත් තීන්දුවට එරෙහිවය. මේ දුම්රිය වැඩවරුම නිසා එදින දසදහස් ගණනක ජනතාව ප්‍රවාහන අපහසුතාවයන්ට මුහුණ දුන් අතර රජයට ආර්ථිකමය අලාබයක්ද සිදු කරන ලදී. මේ තත්වය මත රජයට සිදුවූයේ දුම්රිය සේවය විධිමත් කිරීමට ගත් පියවරයන් අකුලා ගැනීමටය.

පසුගිය ගෝඨා පාලනය බිහිවන්නේ සිස්ටම් චේන්ජ් කළ යුතු බව කියමිනි. එහෙත් කරන්න පුලුවන් වුණේ සිස්ටම් අවුල් කර රට බංකොලොත් කිරීම පමණය. සිස්ටම් චේන්ජ් කිරිල්ල එහෙම කරන්න නොහැකිය මොටර් රථ දෙපාර්තමේන්තුවට කඩා පැන අරම කරපන් මෙහෙම කරපන් කියා ගෝරනාඩු කළද ඒක එහෙම වෙනස් වුණේ නැත. රේගුව දූෂිතයයි කියා රේගුවට කඩා පැන ඒක සුද්ද කරන්න ගියාම වුණේ රේගුව වැඩවර්ජනයකට සූදානම්වීමය. මේ නිසා සිස්ටම් චේන්ජ් කිරීම කළ යුතු සිස්ටම් එකක් තිබේ. එය නොදැන මැතිවරණ වේදිකාවල කෑමොර ගහනවා මෙන් දවසෙන් දෙකෙන් කළ හැකි වන්නේ නැත. පසුගිය අරගල සමයේදී නිතර ඇසුණු වචන කිහිපයක් වූයේත් සිස්ටම් චේන්ජ් කිරීම ගැනය. ත්‍රස්ත බලයක් පාවිච්චි කර රටේ බලය අල්ලගෙන තුවක්කු කටින් රට පාලනය කරන්න ගත්තත් සිස්ටම් චේන්ජ් කිරීම එහෙම කරන්නත් නොහැකිය. මාස 6න් අවුරුද්දෙන් රට ගොඩදාන බව කියන කිසිවකුට එහෙම කිරීමේ ඇත්ත හැකියාවක් ඇත්තේ නැත. ලෝකයේ සිදුවූ සමාජවාදී විප්ලවවලින් පවා රටවල් වෙනස් කළේ මාස 6න් අවුරුද්දෙන් නොවේ. දශකයක් දෙකක් යනකම්වත් යම් ප්‍රතිපත්තියක් සැලසුමක් වැඩපිළිවෙලක් දෘඪ ලෙස ක්‍රියාත්මක කිරීමෙනි. නමුත් ඒවාද එක තැන පල් වී කඩා වැටිණි. පවතින සහ සංවර්ධනය වෙන වෙනසක් කිරීමට නම් පවතින තත්වයන් ගැන පැතිරුණු අවබෝධයක්, දිගු කාලීන අරමුණක්, ඉවසීමක් මෙන්ම උපක්‍රමශීලී භාවිතයන් අවශ්‍යය. මන්ද මේ සියලු සෙල්ලම් කරන්න වන්නේ පණ ඇති මිනිස්සුන් සමග මිස යන්ත්‍ර සූත්‍ර සමග නොවන නිසාය. මල නොතලා රොන් ගන්නා සේ සියුම්ව මෙය සිදු විය යුතුය.

අද මුහුණ දෙන මූලික ගැටළුවක්ව තිබෙන්න රාජ්‍ය සේවය, නියමිත කාල වකවානුවල රටේ ආභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රතිසංකරණය නොවීමේ ගැටළුවය. සුද්දාගේ කාලයේ සිට අටුවම් බැහැපු ක්‍රමවේදයක් වෙනස් කිරීම අද අති දුෂ්කර කටයුත්තක්ව තිබේ. නමුත් මෙය සිදු කළ යුතුය. කොතැනින් හෝ පටන් ගත යුතුය. ඒ සඳහා ධෛර්ය සම්පන්නව මුහුණ දීමට දේශපාලන නායකත්වයක් ද අවශ්‍යය. කොහොම නමුත් අද එය අරම්භ වී තිබේ. වත්මන් ජනාධිපතිවරයා ඊට පියවර ගනිමින් තිබේ. එය සාර්ථකවීම හෝ අසාර්ථකවීම තීරණය වන්නේ මේ රටේ ජනතාවගෙන්, රාජ්‍ය අංශයෙන් ලැබෙන සහයෝගය මතය. නමුත් මෙය විප්ලවීය වර්ගයේ කඩිකුලප්පු වෙනස් කිරීමක් නොවේ. ක්‍රමක්‍රමයෙන් සීරුමාරුවට වන කටයුත්තක් ලෙස සිදු කෙරෙනු ඇත.

පසුගියදා 2023 වර්ෂයේ අයවැය යෝජනාවලිය ඉදිරිපත් කරමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණ යෝජනා ගණනාවක්ම ඉදිරිපත් කර තිබිණි. නමුත් මේවා අලුත්ම අලුත් දේවල්ද නොවේ. මීට පෙර අවස්ථාවලදී ද විටින් විට කතා බහට ලක් වුණු යෝජනාවන්ය. නමුත් එය මෙවර ක්‍රියාත්මක් කිරීමට අදාල අධිෂ්ඨානය සහිතව ජනාධිපතිවරයා ඉදිරිපත් කර නිකම් හිටියේත් නැත. ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ.

ඔහු මීට සති කිහිපයකට පෙර කැබිනට් මණ්ඩල සාකච්ඡාවට ගෙන විත් තිබුණු යෝජනාවක් වූයේ ක්‍රමානුකූල සමාලෝචනයක් මඟින් රාජ්‍ය වියදම් තාර්කීකරණය කිරීම ගැනය. එනම් රජයේ ආදායම් අනුව වියදම් නිසි පදනමක් සහිතව පාලනය කිරීම ගැනය. මෙහිදී රාජ්‍ය වියදම් තාර්කීකරණය කිරීම අරමුණු කරගනිමින් ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේදය (Zero Based Budgeting) හඳුන්වාදීමට යෝජනා කරන ලදී.

ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේදය යනු ආදායම බිංදුව වන විට වියදමත් බිංදුවට සමාන කිරීමේ ක්‍රමවේදයකි. එනම් රුපියල් ලක්ෂයක් උපයන්නේ නම්, ඉතිරි කරන හෝ වියදම් කරන සෑම දෙයක්ම රුපියල් ලක්ෂය දක්වා විය යුතුවීමය. එහිදී උපයන එක රුපියලටත් අරමුණක්, ක්‍රියාවක් සහ ඉලක්කයක් තිබිය යුතුවීමය.

මේ අනුව ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේදය යටතේ ක්‍රමානුකූල සමාලෝචනයක් මඟින් වියදම් වැඩසටහන්වල ද්වි ගණනයන්, අපතේ හැරීම්, අඩු ප්‍රමුඛතාවෙන් යුත් ක්‍රියාකාරකම් සහ දැනට පවතින ප්‍රතිපාදන වෙන් කිරීම් උපයෝජනය කිරීමේ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේද හඳුනාගනු ඇත. ඒ අනුව, මූලික පියවර ලෙස වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ඉහළ ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනු ලබන අමාත්‍යාංශ දහයක් පිළිබඳව ක්‍රමානුකූල සමාලෝචනයක් සිදු කිරීම පිණිස නිලධාරි කමිටු 10ක් පත් කිරීමට ජනාධිපතිවරයා ඉදිරිපත් කළ යෝජනාව මේ වන විට ක්‍රියාත්මකවීම අරම්භ වී ඇත.

එම අමාත්‍යංශ වන්නේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ය. ශූන්‍ය පාදක අයවැයකරණය සමඟ, රාජ්‍ය අයතනයන්හි අය වැය සකස් කිරීමට පෙර සෑම වියදමක්ම සාධාරණීකරණය කළ යුතුය. ශූන්‍ය-පාදක අයවැයකරණයේ ඉලක්කය වන්නේ වියදම් කපා හැරිය හැක්කේ කොතැනද යන්න සොයා බැලීමෙන් වියදම් අඩු කිරීමයි.

සාමාන්‍යයෙන් අය වැයක සළකා බලන කරුණු තුනකි. ආදායම, කොපමණ උපයනු ඇත්ද? කොපමණ මුදලක් වියදම් කරනවාද? ලාභ අලාබ පුරෝකථනය නැතිනම් වියදම්වලින් පසු කොපමණ මුදලක් ඉතිරිව හෝ ණය වී තිබේද? යන්නය.

එමෙන්ම වැදගත් දේ ශූන්‍ය පාදක අයවැයකරණය (ZBB) යනු මුල සිටම අයවැයක් සෑදීමේ ප්‍රවේශයකි. නව අයවැය පදනම් වන්නේ පෙර අයවැය මත නොවේ. ඒ වෙනුවට අයවැය බිංදුවෙන් ආරම්භ වේ. ශූන්‍ය-පාදක අයවැය පියවර අනුගමනය කිරීමෙන්, ඍජුවම ප්‍රතිලාභ ලබාදෙන ආදායම් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා කළ යුතු වියදම් කවරේද යන්න තීරණය කරනු ඇත. එවිට, ඇත්ත වශයෙන්ම සිදුවන්නේ වියදම් කිරීමට නව ක්‍රම සොයාගැනීමය. මේ වෙනුවෙන් ඉලක්ක හඳුනා ගැනීමත්, ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා නව මාර්ග හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ විශ්ලේෂණය කිරීමත් අරමුදල්වලට ප්‍රමුඛත්වය දෙමින් අරමුදල් සපයාගැනීමට නව ක්‍රම සොයාග ැනීත් සිදු කළ යුතුය.

රාජ්‍ය සේවය රටට බරක් නොවී පවත්වාගෙන යෑම වෙනුවෙන් මෙවැනි විධිමත් ක්‍රමාණුකූල ක්‍රමවේදයන් අනුව පවතින ක්‍රම පද්ධතිය වෙනස් කිරීම නැතිනම් සිස්ටම් චේන්ජ් එක විය යුතුය. එසේ නොමැතිව වේදිකාවල්වල කටමැත දෙඩවීම් ප්‍රකාරව කඩිකුලප්පුවට මේවා සිදු කළ නොහැක. විශේෂයෙන්ම සිය ගණනක අණ පනත්, දහස් ගණනක් චක්‍රලේඛ, නීති රීති සම්ප්‍රදායන් සමග සනීභූතව තිබෙන දෙයක් නැවත හැඩ ගැස්සවීම පහසු නැත.

මේ අතර රාජ්‍ය ආයතන සතු අරමුදල් විධිමත් ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් මුදල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතක් හඳුන්වාදීමේ අවශ්‍යතාව 2022 අතුරු අයවැය යෝජනාවක් මඟින් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබිණි. ඒ අනුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල් ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම ලෙස නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට බාරදී තිබේ.

තවත් වැඩසටහනක් ලෙස 2022 අතුරු අයවැය මෙන්ම 2023 වර්ෂය සඳහා වන අයවැය ඉදිරිපත් කිරීමේදී ද රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යූහගත කිරීම සඳහා වන යෝජනාව අනුව, දැනටමත් රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යූහගතකරණ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යූහගත කිරීමේ ඒකකය ස්ථාපිත කරනු ලැබ ඇත. ප්‍රතිව්‍යූහගතකරණය කිරීම සඳහා අපේක්ෂිත ආයතන අතුරින් ඇතැම් ආයතන රජය සතු සමාගම් වන අතර එවැනි ඇතැම් සමාගම්වල බහුතර කොටස් රජය සතුව පවතී. එසේම, සමහර රාජ්‍ය ව්‍යවසායයන් සංස්ථා වශයෙන් ක්‍රියාත්මක වේ. එම තත්ත්වය යටතේ රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යූහගතකරණ වැඩසටහන කඩිනම් කිරීමට හැකි වන පරිදි 100%ක කොටස් හිමිකාරිත්වය භාණ්ඩාගාරයේ ලේකම් සතු වන අයුරින් මහා භාණ්ඩාගාරයට අනුබද්ධිත මව් සමාගමක් ස්ථාපිත කිරීමටත්, ප්‍රතිව්‍යූහගතකරණය සඳහා හඳුනාගනු ලබන රාජ්‍ය ව්‍යවසායයන් එකී මව් සමාගමට අනුබද්ධිත සමාගම් ලෙස ලියාපදිංචි කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සිදුවෙමින් තිබේ. මේවා දවසින් දෙකෙන් කළ හැකි සරල ක්‍රියා මාර්ග නොවේ.

ආර්ථිකය ශක්තිමත්ව ගොඩනැඟීම, රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සහ රජය සතු සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අරමුණු කරගෙන හඳුන්වාදීමට දැනට පවතින පනත් කිහිපයක විධිවිධාන සංශෝධනය කිරීමත් සිදුවෙමින් තිබේ. ඒ අතර, මහා භාණ්ඩාග ාරය යටතේ පවතින කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ රාජකාරි කටයුතු පුළුල් කර ඊට නෛතිකභාවයක් ලබා දීමටත්, ජාතික වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමට සහ රාජ්‍ය වත්කම් සම්බන්ධ මධ්‍යගත දත්ත පද්ධතියක් හඳුන්වා දීමටත් හැකි වන පරිදි යෝග්‍ය විධිවිධාන ඇතුළත් කරමින් 'රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත' ඉදිරිපත් කිරීමේ කටයුත්තත් සිදුවෙමින් තිබේ.

මේ අතර නූතන තාක්ෂණික ලෝකයට ගැලපෙන වඩාත් ඵලදායි, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සහතික කිරීම වෙනුවෙන් ChatGPT (චැට්GPT) - කෘත්‍රිම බුද්ධිය උපයෝගී කර නව යුගයක ආරම්භය සනිටුහන් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට තාක්ෂණික අමාත්‍යංශය කටයුතු කරමින් තිබේ. ඒ අනුව ඉදිරියේදී පුරවැසියන්ට වඩා හොඳ සේවාවන් සැපයීම වෙනුවෙන් ලංකාවේ රජයේ කාර්යාල තුල මේ නූතන තාක්ෂණික භාවිතාව අත්දකින්න ලැබෙනු ඇත. සිස්ටම් චේන්ජ් වෙනවා කියන්නේ මේකටය. කක්කුටු බෙන වහන්නේ නැතුව වක්කඩ වැහුවාට වැඩක්වෙන්නේ නැතිවා සේම ආණ්ඩු මාරු කළාට, පාලකයන් පැන්නුවාට, හොරු අල්ලා හිරේට දැම්මාට අවශ්‍ය දේ වන්නේ නැත. ගැටළුවට මූලික හේතු සොයා මුලින් පිළියම් කළ යුතුය.

මේ අනුව පැහැදිලිම කාරණාව වන්නේ කඩි කුලප්පුවට, විධායක බලය තිබුණද, ආණ්ඩුවේ බලය තිබුණද දේවල් කළ නොහැකි බවය. ඒ සඳහා පියවර ගත යුතුවීමේ ක්‍රමාණුකූල විධික්‍රම තිබේ. ඒවාට යම් කාලයක් ගතවීමත් සාධාරණය. දැන් ආණ්ඩු බලය ගත්තා කියා කිසිවකුට රට වෙනස් කිරීම තබා රාජ්‍ය දෙපාර්තමේන්තුවක් වෙනස් කිරීමත් කටේ හයියෙන් හෝ අරගලයේ හයියෙන් නෙවෙයි නම් තුවක්කුවේ බලයෙන්වත් කළ නොහැක. නමුත් මාස 6න් හරි අවුරුද්දෙන් හරි රට හදනවා කියන අයට ජනාධිපති රනිල් රට හදන්න අවශ්‍ය පදනමට නැතිනම් ඒ පාරට රට ගෙනත් දැමීමෙන් පසුව නම් ඒ කටයුත්ත කළ හැකි වෙනු ඇත. නමුත් ඒ සඳහාත් ඇත්ත අධිෂ්ඨානයක් මෙන්ම හරි පාරේ යෑමේ හැකියාව සහිත විය යුතුය. රනිල්, 2048 දී සංවර්ධිත රාජ්‍යයක අපේක්ෂාව ජය ගත හැකිය කිව්වේ මේ පාරේ යන්නට අනාගත නායකයන්ට හැකි නම් පමණි. ඒ මොනවා කරන්නත් අද රනිල්ට, ඒ පාර සැකසීමේ අවස්ථාව දිය යුතුය. එවිට මේ පාර කොහෙටද කියා අසන්නට අවශ්‍ය වන්නේ නැත. විසඳුම කුමක්ද කියා අසන්නට අවශ්‍ය නැත.

ජයතුංග බණ්ඩාර

# හරිනි, ඔයාට දැන් කොහොමද? තාමත් ඒ විදියද?



13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී හරිනි අමරසූරිය පසුගිය දිනෙක The Island පුවත්පතට ප්‍රකාශ කර සිටියේ **"එය ඉදිරිපත් කර තිබෙන්නේ ජාතික ගැටලුවට විසඳුමක් ලෙසයි. එය දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අතර එය ක්‍රියාවට නැංවිය යුතු බව අප විශ්වාස කරන නමුත් එය ජාතික ගැටලුවට සාධාරණ විසඳුමක් විය හැකිද යන්න පිළිබඳව අපට විවාදයක් තිබේ"** යන්නය.

හරිනි අමරසූරිය යනු විශ්වවිද්‍යාල ආචාර්යවරියකි. ඇය ලෝකය හා ලෝකයේ දේශපාලන මතිමතාන්තර සම්බන්ධයෙන් අවබෝධයක් ඇති තැනැත්තියකි. එසේම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ප්‍රශ්න විග්‍රහ කර ගැනීමට උන්නදුවක් දක්වන බවත් ඇය පෙන්වා තිබේ. මේ නිසාම ඇය මෙතෙක් හැදැරූ දේශපාලනික ශබ්දකෝෂය අනුව 13වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාවට නැංවිය යුතු බව කීම සත්‍යයකි. එනම් බලය බෙදාහැරීමේ යම් ක්‍රමවේදයක් අනුව මේ ගැටලුව විසඳිය යුතු බවය.

එහෙත් අමරසූරිය මහත්මියගේ දේශපාලන කියවීම එසේ වුවද ඇය නියෝජනය කරන පක්ෂයේ අරටුව නැතිනම් මව් පක්ෂය දරනුයේ ඉඳුරා වෙනස් මතයකි. ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා පසුගියදා ප්‍රකාශ කර සිටියේ, **"මේ අටවලා තියෙන්නේ උගුලක්. ජාතිවාදී උගුලක් මේ අටවලා තියෙන්නේ. ජනතාව අතර ගැටුම් හදන උගුලක් අටවලා තියෙන්නේ. ජනතාව අධිෂ්ඨානයෙන් රට වෙනස් කරන්න හදනකොට ඒකට බාධා කරන්න උගුලක් මේ අටවලා තියෙන්නේ. ඒ උගුලට උදව් කරන්න බංකොලොත් ජාතිවාදී නඩත් ලෑස්ති වෙලා තියෙන්නේ. ඒ නිසා ජාතිවාදී උගුලට අහුවෙන්න එපා. උතුරු නැගෙනහිර ජනතාවගේ ප්‍රශ්න විසඳිය යුතුයි. ඒත් ඒක මේගොල්ලන්ට කරන්න බෑ"** යන්නය.

ජවිපෙ ලේකම්වරයාට අනුව උතුරු නැගෙනහිර ජනතාවගේ ප්‍රශ්නය විසඳිය යුතු බව කියයි. ඒ අතරම මෙය මර උගුලක් බවද කියයි. කෙසේ නමුත් 13වන ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගුව පසෙකින් තබන ලේකම්වරයා පවසන්නේ මේගොල්ලන්ට කරන්න බෑ යන්නය. මේ නොකියා කියන්නේ අපට මෙය විසඳිය හැකි බවය. හැබැයි ඒ කවදා හෝ තනනවා කියන ජවිපෙ ආණ්ඩුවක් යටතේ ය. ඒ ආන්ඩුව ආවත් කවදා හරි ගෙනෙන නව ව්‍යවස්ථාවක් හරහා ය.

කෙසේ නමුත් පසුගිය කාලය පුරාම ජනාධිපති රනිල් වික්‍රමසිංහ 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට පක්ෂව පෙනී සිටියේය. ඒ වෙනුවෙන් වන සර්ව පාක්ෂික සාකච්ඡාවක් ද කැඳවූ අතර ජවිපෙ ඊට සහභාගී වූයේ නැත. එසේම ජවිපෙ ජාතිවාදී පදනමක සිට 13ට එරෙහිව දශක කිහිපය තිස්සේම දැරූ උග්‍ර විරෝධය, මාරාන්තික වීදී සටන් සිදු කිරීමක් මේ කාලය තුළ නොදැක්කේය. ඒ වෙනුවට තැනින් තැන විවිධ සහෝදරවරුන් 13ට පක්ෂ බව දැක්වෙන ඇඟවීම් සිදු කරමින් ගියේය. මේ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ දිගින් දිගටම ප්‍රශ්න කිරීම් කර තිබිණි. විවිධ පුද්ගලයින් පැවසුවේ ජනතා විමුක්ති පෙරමුණේ 60,000කට ආසන්න සාමාජිකයන් හිතවතුන් මිය ගියේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය පදනම් කරගෙන සිදුකළ කැරළි ගැසීම් හමුවේ බවත් දැන් ජවිපෙ 13ට විරුද්ධ නොවෙමින් ඝාතනයට ලක්වූවන්ට නින්දා කරන බවයි. එසේම ජවිපෙ දැන් ධනේෂ්වර ලිබරල් මොඩලය අනුගමනය කරමින් සිටින පක්ෂයක් බවයි.

මේ තත්වයන් මෙසේ පවතිද්දී ජාතික ජන බලවේගයේ ඇතැම් විද්වතුන් මෙම දේශපාලන විසඳුම සම්බන්ධයෙන් වන තම මතයන් ජාතිවාදී පදනම් මත විග්‍රහ කිරීමට ප්‍රයත්න දැරීය. මේ අතරින් හරිනි විසින් දැක්වූ මතවාදය මැදිහත් මතධාරීන් විසින් උත්කර්ෂයට නංවනුද පෙනෙන්නට තිබිණි. කොහොම නමුත් දේශපාලන විසඳුම පිළිබඳ තියුණු සංවාදයකට හරිනිගේ මැදිහත්වීම තව දුරටත් සිදුවෙතැයි බලාපොරොත්තු වූවද හරිනි දේශපාලන කරලියෙහි නොපෙනී ගියේය. බොහෝ විට ජවිපෙ බලපෑම මත ඇයව කාලයකට ප්‍රසිද්ධ තලයේ අදහස් දැක්වීමෙන් ඉවත් කර තැබීමට කටයුතු කළාද යන සැකය ද මතුවිය. කොහොම නමුත් හරිනි දැරූ මතය නිසා ජවිපෙ හා ජාජබ අතර වන අභ්‍යන්තරික මත ගැටුම් නිර්මාණයවීමට පටන් ගත්තද එය කරළියට පැමිණීම වළක්වාලීමට පවතින මැතිවරණ උණුසුම බලපෑවේය.

මේ සිද්ධිදාමයේ තවදුරටත් පූර්වාපර සන්ධි ගලපන්නට උවමනාවක් නැත. ජවිපෙ යනු දිගින් දිගටම කවර මට්ටමේ හෝ බලය බෙදීමක් සම්බන්ධයෙන් තම මුල් නායකයාගේ සිට උග්‍රතම විරෝධයක් ප්‍රකාශ කළ පක්ෂයකි. එහෙත් අද තත්වය වෙනස්ය. නිහඬය. මේ සඳහා හේතු කාරණා විනිශ්චයේදී ඇත්ත ජවිපෙ උවමනාව පැහැදිලි කරගත හැකි වනු ඇත. දැන් ජනතා විමුක්ති පෙරමුණ හෝ සීනුව ජනතාවගේ මතකයෙන් ඈත් කර ඇත. දැන් ප්‍රදර්ශනයට තබා ඇත්තේ ජාජබය නැත්නම් මාලිමාවය. එය දම් පාටය. ලිබරල් වටිනාකම් අගයයි. එම පිටකවරය නිර්මාණය කළේ පිටස්තර සිවිල් චරිත ගණනාවක් විසිනි. නමුත් ඇතුළත පරණ හණ මිටි මතවාදයන් පුරවාගත්, ජාතිවාදී, ත්‍රාඩ, ජවිපෙ සැඟව සිටී. වෙනත් කිසිදු පක්ෂයක් සංවිධානයක් මාලිමාව තුළ නැත. මේ නිසාම 13 ප්‍රශ්නය හමුවේ හැව ඇරීම මේ වෙලාවේ බරපතල වැරැද්දක් බව ජවිපෙ ගණන් හැදීමය. එයට හේතුව දේශපාලන රැල්ල හැදී ඇත්තේ මාලිමාවට බලය ලබා ගැනීම සඳහාය. එබැවින් ජවිපෙ නිළ මතයන් ජනතාවට දැන් අදාළ නැත. එසේම මාලිමාවද 13 සම්බන්ධයෙන් නිහඬ කර තිබේ. නැතහොත් හරිනිලා 13ට හෝ බලය බෙදා හැරීමට පක්ෂව මතවාදයක් ගොඩනැඟීම ජවිපෙ දේශපාලනය අර්බුදයට යවන්නක්වීම අනිවාර්ය තත්වයකි. එසේම ජවිපෙ නායකත්වයට ප්‍රතිපක්ෂව වෙනත් නායකත්ව භූමිකාවක් ගොඩනැඟීම සිදුවෙයි. මේ තත්වය හමුවේ හරිනිගෙන් දැන් අහන්න තියෙන්නේ ඔයා තාමත් 13ට පක්ෂ ද? කියා නමුත් හරිනි ආගිය අතක් නැත.

එමෙන්ම අනුරලාට, ටිල්වින්ලාට, ලාල් කාන්තලාට, 13 උගුලක්ය කියනවාට වඩා දෙයක් කියන්නටද නොහැක. තමන් ප්‍රශ්නය විසඳනවාය කිව්වත් ඒ බලය බෙදා හැරීමෙන්ද නැතිනම් මධ්‍යගත කිරීමෙන්ද යන්න ගැන හෝ සිය ප්‍රතිපත්තිය කුමක්ද යන්න හෝ ගැන ජවිපෙ නිහඬය. මාලිමාව සහ ජවිපෙ, 13 සම්බන්ධයෙන් දරණ මතය හෙළිදරව්වීම වැළැක්වීම ජවිපෙ උපක්‍රමය වී ඇත්තේ

> **කෙසේ නමුත් පසුගිය කාලය පුරාම ජනාධිපති රනිල් වික්‍රමසිංහ 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට පක්ෂව පෙනී සිටියේය. ඒ වෙනුවෙන් වන සර්ව පාක්ෂික සාකච්ඡාවක් ද කැඳවූ අතර ජවිපේ හෝ ජාතික ජන බලවේගය ඊට සහභාගී වූයේ නැත. එසේම ජවිපෙ ජාතිවාදී පදනමක සිට 13ට එරෙහිව දශක කිහිපය තිස්සේම දැරූ උග්‍ර විරෝධය, මාරාන්තික වීදී සටන් සිදු කිරීමක් මේ කාලය තුළ නොදැක්කේය. ඒ වෙනුවට තැනින් තැන විවිධ සහෝදරවරුන් 13 පක්ෂ බව දැක්වෙන ඇඟවීම් සිදු කරමින් ගියේය. මේ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ දිගින් දිගටම ප්‍රශ්න කිරීම් කර තිබිණි.**

බලය අත්පත් කර ගැනීමේදි ඡන්දදායකයා ඇත්ත දැන ගැනීම වැළැක්වීමට සිදුව තිබෙන නිසාය.

කොහොම නමුත් වාර්ගික ප්‍රශ්න වෙනුවෙන් පාර්ලිමේන්තුවට පැමිණි දෙමළ සන්ධානය 13 වන ව්‍යාවස්ථාව මුළුමනින්ම ක්‍රියාත්මක කරවා ගැනීමට උත්සාහ දරයි. ඉන්දියාවත් දිගටම බලපෑම් කළේය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම තුළත් මේ බලපෑම සිදුවිය. විපක්ෂය කියන විදිහට මැතිවරණය අස්සේ ජනාධිපතිවරයා හදිස්සියේ 13 කරළියට ගෙන ඒම වෙන යම් උගුලක් ඇටවීමක් නොවේ. මෙය පරක්කු වී ඇති හදිස්සි වැඩක් ලෙස දශක ගණනාවක්ම නොකෙරී තිබුණු දෙයකි. මේ සාකච්ඡාව දිගටම තිබිණි. ඒ කඩුල්ල පැනගැනීම වත්මන් ආර්ථික අර්බුදය ජය ගැනීම වෙනුවෙන් වන අතිරේක සහයක් ලෙසද පවතී. විශේෂයෙන්ම දෙමළ ඩයස්පෝරා සංවිධාන මෙරට තුළ ඩොලර් බිලියන ගණනක් ආයෝජනය කිරීමේ පොරොන්දුව දී ඇත. ඒ උතුරට සීමාවීමක් නොවේ. ප්‍රතිලාභය සමස්ථ රටේ අභිවෘද්ධියටය. ඇතැම් දෙමළ දේශපාලන පක්ෂ 13 ක්‍රියාත්මක කරවීමට ජනාධිපතිවරයා ගන්නා උත්සහය හමුවේ අඩියක් පස්සට ගැනීම මේ මැතිවරණ මොහොතක දේශපාලනික කාරණයකි. මන්ද ජතිවාදී පදනමක සිට කටයුතු කිරීමේ දී උතුරේ දෙමළ ඡන්ද වාසිය ලබා ගැනීමේ හැකියාවය. හිඟන්නාගේ තුවාලය මෙන් මේ ගැටලුව තබා ගැනීම උතුරෙ දකුණේ කියා වෙනසක් නැති බව ජනාධිපතිවරයාගේ එළැඹුම විසින් හෙළිදරව් කර තිබේ.

කෙසේ නමුත් ජනාධිපතිවරයා මූලිකවම මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළේ සර්වපාක්ෂික සාකච්ඡාවන් සහ පාර්ලිමේන්තුව හරහා ගැටළුව විසඳීමටය. බලය බෙදීමේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කිරීම සඳහා සෑම පාර්ශ්වයකටම පිළිගත හැකි එකඟතාවයක් අනුව වැඩපිළිවෙලක් සකස් කිරීමය. මේ සඳහා ප්‍රධාන විපක්ෂය වන සමගි ජන බලවේගය ද කර ඇරියේය. අනාගත ජනාධිපති සිහිනයේ සිටින සජිත් ප්‍රේමදාස උතුරේ ප්‍රශ්නය සම්බන්ධයෙන් හෝ බලය බෙදාහැරීම සම්බන්ධයෙන් මෙලෝ හසරක් නොදන්නා අයෙකු සේ කටයුතු කරයි. මේ අනුව සමගි ජන බලවේගය ද ඡන්ද ගොඩ දිනා ගැනීම ප්‍රමුඛ නිසා ඇත්ත ප්‍රශ්නය මඟ හැර ඇත.

ජනතා විමුක්ති පෙරමුණ, ජතික ජන බලවේගය හා සමගි ජන බලවේගය 13 වන ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඇත්ත මතය ප්‍රකාශ නොකර වෙන විකාර රඟ දැක්වූවද ජනාධිපතිවරයා වාර්ගික ගැටළුව සඳහා වන දේශපාලන විසදුම වෙනුවෙන් හැමදාම එකම මතයක සිටියා පමණක් නොව කවර දේශපාලනික අවාසියක් සිදු වූවත් ඒ නොබියව ප්‍රකාශ කිරීමට තරම් දේශපාලනික හයියක් ඔහුට තිබිණි. පසුගියදා යාපනයේ සිදු කළ සංචාරයේ දී පැවැති රැස්වීමකට සහභාගී වෙමින් ඔහු එය නිවැරදිව මෙසේ සදහන් කොට සිටියේය.

**"අපි බලන්නේ දැන් 13 වන ව්‍යවස්ථා සංශෝධන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්න. ඒක උතුරේ ප්‍රශ්නයක් විතරක් නෙමෙයි. අපේ දකුණේ මහ ඇමතිවරුත් ඉල්ලනවා මේක ක්‍රියාත්මක කරන්න කියලා. ඒ නිසා අපි කතා කරලා ඒවත් ක්‍රියා කරන්න යනවා. ඉතින් මේ ටික අපි ක්‍රමානුකූලව කරගෙන යමු. ඊළඟ අවුරුද්දේ දෙකේදී. අද දිළිඳුකම, බඩගින්න, විරැකියාව, දෙමළ අයටවත් සිංහල අයටවත් සීමා වෙලා නැහැ නේ. අපි ඔක්කෝම දුක් විඳිනවා. අපි ඔක්කෝම එකතු වෙලා ගොඩ එන්නට ඕනේ. ඉතින් මේ අද තියෙන්නේ උතුරේ ද්‍රවිඩ අයගේ ප්‍රශ්න විතරක් නෙමෙයි. තවත් ප්‍රශ්න තියෙනවා සාකච්ඡා කරන්න. ඉතින් මේ සාකච්ඡාවලින් පස්සේ මම විශේෂයෙන් ම කඳුකරයේ ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුත්, පාර්ලිමේන්තු පක්ෂ නායකයින් ගෙනල්ලා දෙවැනි වටය ආරම්භ කරනවා. කඳුකරයේ දෙමළ ජනතාව අපේ සම්පූර්ණ සමාජයට අන්තර්ගත කරලා. අපි ඒ අයට සිංහල, දෙමළ, මුස්ලිම් අය විඳින අයිතිවාසිකම් හා සමාජයේ ලැබෙන භුක්තිය ඒ අයටත් ලබලා දෙනවා"**

මේ අනුව බලයට කෑදරව ඇත්ත ප්‍රශ්න සඟවමින් ව්‍යාජ ප්‍රශ්න තොරොම්බල් කරමින් ජනතාව නොමඟ යවමින් සියලු දේශපාලන බලවේගයන් පසුපසට යවා ජනාධිපති රනිල් වික්‍රමසිංහ එඩිතර තීරණයකට පැමිණ තිබෙන බව පැහැදිලිය. මේ ප්‍රශ්නය අද විසඳා ගත්තොත් එහි ප්‍රතිලාබය උතුරේ නැගෙනහිරේ ජනතාවට පමණක් නොවේ, රටටමය. ඒ නිසා බලලෝභීත්වය දේශපාලනය කරගත් බලවේග රටක, ජනතාවකගේ ප්‍රශ්න විසඳීම ගැන බිය වීම ගැනත් පැහැදිලිකමක් මේ 13 ප්‍රශ්නය මතින් පෙන්නුම් කර තිබේ.

කේ.පී.අයි. ප්‍රියංගනී

# විදුලි බිල වැඩි නම් අඩු කරගන්න



විදුලි බිල් වැඩිවීම ජාතික ආපදාවක් කරගැනීමට විපක්ෂ දේශපාලන පක්ෂ මෙන්ම මාධ්‍ය ආයතනය සහ සමාජ මාධ්‍ය තුළ ද දැඩි උත්සාහයක් ගනිමින් තිබෙන බව පෙනෙන්නට තිබේ. මේ අමුතු තත්වයක් නොවේ. ඒ ඒ අයට එහෙම කරන්න වෙන වෙන පාර්ශ්වික හේතු තිබේ. කොහොම නමුත් විදුලි බිල් වැඩිවීම බැලූ බැල්මටම ජනතාවට දරා ගන්න නොහැකි බව පිළිගැනීමට සිදුවේ. මන්ද හිටි හැටියේම ඉහළ ගිය ගාස්තුවල ඉලක්කම් බර වැඩිය.

මෙවර මිල වැඩිවීමේ ප්‍රතිශතයන් දෙස බැලූ විට වැඩිම ප්‍රතිශතයකින් මිල වැඩි වී ඇත්තේ ගෘහස්ථ පාරිභෝගිකයින්ටය. එයත් මාසික ඒකක 90ට වඩා අඩුවෙන් පාවිච්චි කරන පිරිසටය. මේ අනුව බිල වැඩිවීමෙන් වැඩිම පහරක් වැදුනේ පොඩි මිනිහාට ලෙස මත දැක්වීමත් සාධාරණය.

මෙරට වැඩිම විදුලි ප්‍රමාණයක් පාරිභෝජනය කරන්නේ ගෘහස්ථ පාරිභෝගිකයින්ය. ගෘහස්ථ විදුලි පාරිභෝගිකයන් ලක්ෂ 64කට ආසන්න ප්‍රමාණයක් සිටින අතර ඉන් ලක්ෂ 48ක් ඒකක 90ට අඩුවෙන් භාවිතා කරන කාණ්ඩයට අයත්ය. මේ අනුව වැඩිම පිරිසකට පීඩනයක් දරාගන්න සිදුව ඇති බව ඉලක්කම් අනුව පෙනෙයි.

නමුත් මෙහි අනෙක් පැත්තක් ද තිබේ. විදුලි ඉල්ලුම සපුරාලීමේදී රජයට දරා ගත හැකි සීමාවක් තිබේ. වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන වෙනුවෙන් වැය කිරීමේ හැකියාව සීමාසහිතය. විදුලිබල මණ්ඩලයට මේ වෙනුවෙන් අවශ්‍ය ඩොලර් ප්‍රමාණය නැත. ඩොලර් මිලදී ගන්න රුපියල් ද ප්‍රමාණවත් නැත. වියදම් තරමට ආදායම නැති නිසා ඒ තත්වය උදා වී ඇත. භාණ්ඩාගාරයෙන් එම මුදල් ලබා දීමට ද දැන් කළ හැකි නොවේ. ඒ අතර තෙල් සංස්ථාවට ද, බැංකුවලට ද බිලියන් ගණනින් ණයය. මේ අසරණ තත්වය මත අදටත් විදුලිය නොකපා ලබාදීමේ හැකියාව ලැබෙන්නේ මීට පෙර විදුලි බිල් වැඩි කිරීමට පියවර ගැනීමත් සමඟ ජනතාව විදුලිය පාවිච්චිය සීමා කිරීමට පෙළඹීම මත විදුලි ඉල්ලුම අඩුවීම මතය.

එසේ නොවන්න මීට වසරකට හමාරකට පෙර තිබූ විදුලි ඉල්ලුම තව දුරටත් තිබුණා නම් දිනකට පැය දහය දොළහ කැපීමට සිදු වෙනු ඇත. මන්ද තවමත් රට මුහුණ දෙමින් තිබෙන ආර්ථික අර්බුදය ජය ගැනීමේ හැකියාවක් ලැබී නැති නිසාය. ජනධිපතිවරයා විදුලිය නොකපා ලබා දීමට තරම්වත් මේ ප්‍රශ්නය යන්තම් බේරාගෙන තිබීමත් මේ මොහොතේ අගය කළ යුතු දෙයකි.

කොහොම නමුත් වත්මන් විදුලි බිල වැඩිවීමත් සමග විශේෂයෙන්ම විදුලි බලය පාවිච්චි කිරීම තවදුරටත් අරපිරිමැස්මෙන් කිරීමට ආණ්ඩුවට බැන බැන, ජනාධිපතිට හෙණ ඉල්ල ඉල්ල හෝ සියලු දෙනා කරනවාට සැක නැත. ඒ අනුව විදුලිබල උත්පාදනය වෙනුවෙන් වන වැය බර තවදුරටත් අඩු කරගැනීමේ හැකියාවක් විදුලිබල මණ්ඩලයට ලැබෙනු ඇත. ඒ අනුව අඛණ්ඩ විදුලිබල සැපයුමක් වෙනුවෙන් මෙතෙක් තිබූ පීඩාකාරිත්වයෙන් යම් සහනයක් විදුලිබල මණ්ඩලයට මෙන්ම රජයටද ලැබෙනු ඇත.

මේ ඇත්ත අර්බුදය මග හැර යාම සිදු කළ නොහැකිය. විදුලි බිල වැඩිවීම අද දින වන විට ගැටලුවක් වන්නේ එය මෙතෙක් නිදහසේ පාරිභෝජනය කළ ප්‍රමාණය තවදුරටත් පාරිභෝජනය කිරීමේ හැකියාව නොලැබේය කියන බිය නිසාය. ඉවක් බවක් නැතිව සහන මිලට ලැබුණු විදුලිය පාවිච්චි කිරීමේ පුරුද්ද නිසා මෙය බරපතල ගැටලුවක්ව පෙනෙනවා මිස මේ තත්වයන් නියමාකාරයෙන් කළමණාකරණය කරගැනීමට හැකි නම් මෙය ගැටළුවක් වන්නේ නැත. ඊට පුරුදුවීම හැර මේ මොහොතේ වෙනත් විසඳුම් නැත.

විදුලිබල මණ්ඩලය මුහුණ දෙන ගැටලුව නම් සහන මිලකට මෙතුවක් කල් විදුලිය ලබාදීම ය. ඒ වරද නිවැරදි කර නොගෙන විදුලිය අඩු මිලට ලබාදීම ය. අද ක්‍රියාත්මක කර ඇත්තේ විදුලි ජනන වියදමට සරිලන මුදල එම පාරිභෝගිකයාගෙන් අය කරගෙන සාධාරණ යුක්ති සහගත වෙළඳ ගනුදෙනුවක් කරන තැනට පත් කිරීමය. වෙනදා මණ්ඩලය අඩු මිලට විදුලිය දීම නිසා ලබන පාඩුව පියවූයේ මහා භාණ්ඩාගාරයෙනි. මහා භාණ්ඩාගාරයේ ඇත්තේ ජනතාවගෙන් අය කරන බදු ආදායම්ය. දේශපාලනික වාසි තකා ඒ ඒ ආණ්ඩු විසින් බදු ආදායම්වලින් මේ පාඩු පියවීම නිසා එම බදු ආදායම්වලින් කළ යුතු අත්‍යාවශ්‍ය කටයුතු වෙනුවට මේ අනර්ථකාරී, මෝඩ වැඩේ කරන්නට සිදුව තිබිණි. අවසානයේ රජය පවත්වාගෙන යෑමට තරම් ආදායම් නැතිව අවසානයේ බංකොළොත් වෙන තැනට පත් විය. පැය දහය දොළහා විදුලිය නැතුව සිටියේ ඒ බංකොලොත්වීම නිසාය. මේ විෂම චක්‍රය කඩා වෙනස් කර නිවැරදි පිළිවෙතකට ගෙන ඒම දැන් සිදුව තිබේ.

> **මේ ඇත්ත අර්බුදය මග හැර යාම සිදු කළ නොහැකිය. විදුලි බිල වැඩිවීම අද දින වන විට ගැටලුවක් වන්නේ එය මෙතෙක් නිදහසේ පාරිභෝජනය කළ ප්‍රමාණය තවදුරටත් පාරිභෝජනය කිරීමේ හැකියාව නොලැබේය කියන බිය නිසාය. ඉවක් බවක් නැතිව සහන මිලට ලැබුණු විදුලිය පාවිච්චි කිරීමේ පුරුද්ද නිසා මෙය බරපතල ගැටලුවක්ව පෙනෙනවා මිස මේ තත්වයන් නියමාකාරයෙන් කළමණාකරණය කරගැනීමට හැකි නම් මෙය ගැටළුවක් වන්නේ නැත. ඊට පුරුදුවීම හැර මේ මොහොතේ වෙනත් විසඳුම් නැත.**

නමුත් මේ පිළිවෙත පිළිවෙලක් වන්නේ ක්‍රම ක්‍රමයෙනි. අද විදුලි බිල් වැඩි යැයි කරන මැසිවිලිවලට හේතුව ජනතාවගේ ආදායම් ප්‍රශ්නය නිසාය. අද බඩු මිල වැඩි වී ඇති තත්වයන් මත තවත් අමාරුය. නමුත් උද්ධමන තත්වයන් අඩු වී පොලි අනුපාතයන් අඩු වී රට සාමාන්‍ය තත්වයට පත්වීමට තවත් කෙටි කාලයක් ගත වෙනු ඇත. විශේෂයෙන්ම එළඹෙන මාර්තු මාසය අවසන් වන විට දී පමණ ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සහය ලැබීමත් සමඟ රටේ ආදායම් ගැටලුව ක්‍රමයෙන් විසඳනු ඇත. එතෙක් මාස කිහිපයක් දුෂ්කරතාවයන් අත්විඳීමට සිදුවීම අනිවාර්ය තත්වයකි. ආණ්ඩු මාරු කළාට පාලකයන් මාරු කළාට මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැත. මන්ද අර්බුදයෙන් ගැලවීමට ඉතුරුව ඇති එකම පියවර මේ ක්‍රියාමත්ක කරමින් සිටින ක්‍රමවේදය මිස වෙනකක් නොවන නිසාය. ජනාධිපතිවරයා ඉල්ලා සිටියේ මෙම 2023 වසර ඒ වෙනුවෙන් කැප කරමු කියාය. 2024 වන විට යම් සහනදායක තත්වයක් ලබා තවත් වසරකින් අතිශය සාමාන්‍ය තත්වයට පත් විය හැකි බවය. ජවිපෙ අනුර කුමාරට පවා දැන් කියන්න සිදුව ඇත්තේ තමන් බලයට ආවත් තව වසර හතරක් පහක් දුෂ්කර තත්වයකින් හැර මේ ප්‍රශ්නයෙන් ගොඩ ආ නොහැකි බවය. ඇත්ත එයය.

ඊට මුහුණ දෙනවා විනා පාරට බැස අරගල සියයක් කළත් විසඳිය හැකි දෙයක් නැත. මීට මස 6කට පෙර රට තිබූ තත්වය, ජනතාව විඳි පීඩාවන් මතක් කරගන්නේ නම් අද මේ සිටින තත්වය දාහකින් සම්පතකි.

ප්‍රභාත් ජයසුමන




## රතු මල්ලිලාගේ ෂැර

කාලෙකට පස්සේ සයිමා ඩප්පියා එක්ක පොඩි රවුමක් දාන්න හිතාගෙන මහරගම පැත්තේ සාප්පු සවාරියකට සෙට් වුනේය. ඩල්සි එක්ක මේ ගමන ගියොත් අතේ පිච්චියටත් තට්ටු වෙන නිසා ඩප්පියාව සෙට් කරගෙන ගියේය. නුගේගොඩත් පහුවෙලා දෙල්කඳ හන්දියට පහුකරද්දී කොල්ලෝ දෙන්නෙක් ත්‍රීවිලරයට අත දැම්මේය.

"සයිමයියා මොකද කරන්නේ නතර කරන්නද කැම්පස් කොල්ලෝ දෙන්නෙක් වගේ"

"දාගෙන යමං මං විතරයිනේ පිටි පස්සේ"

ඩප්පියා ටුක් ටුක් නතර කොට කොල්ලෝ දෙන්නා නංවාගෙන ඇද්දේය.

"මල්ලිලා කොහේද යන්නේ" සයිමා කොල්ලෝ දෙන්නාගෙන් ඇසීය.

"කැම්පස් ඒකට අයියේ..."

"මේ හවස මොන කැම්පස්ද?"

"නෑ පොඩි වැඩක් තියෙනවා හවස අපේ සෙට් එකක් දාගත්තු ඒකට යන්නේ"

"ආහ්... හොදයි හොදයි. අපි ඉතිං ඔච්චා ගැන දන්නේ නැනේ මල්ලී අධ්‍යාපනය කියන ඒක ඉතිං කොයි වෙලාවේ ලැබුනත් මොකද නේද?

කොල්ලා මද සිනාවක් පෑ අතර "අපි ඔය ඉස්සරහින් බස්සන්න අයියේ" යැයි කීය.

විජේරාම හන්දියට ළං වෙද්දී සයිමා ඩප්පියාට අතින් කැම්පස් එක පැත්තට හරවන ලෙස කීය. ඒ අනුව විජේරාමෙන් කැම්පස් එක දෙසට ටුක් ටුක් ඒක ගමන් කළේය.

කැම්පස් ගේට්ටුව ළඟට එන විට විශාල පිරිසක් ගේට්ටුව අසල පොදියට ගුටි බැට හුවමාරුවකය. පොලු රැගෙන පිරිසක් තවත් පිරිසකට හොදට නෙළන්නේය.

"අඩෝ කවුද යකෝ අපේ උන්ට ගහන්නේ යැයි කියමින් ත්‍රීවිලරයේ ආ කොල්ලෝ දෙන්නා පැන ඒ දෙසට දිව්වේය. සයිමාට තත්වය පැහැදිළි විය. අපි බං මේවාට මැදිහත් නොවී යමු යැයි කියන විටත් ත්‍රීවිලය නතර කළ ඩප්පියා ගේට්ටුව ළඟට ගොස් කොල්ලෙකුට වදින්නට ආ පොලු පාරක් වළක්වා ඒකාව බේරා ගත්තේය.

සයිමාටත් නිකන් ඉඳ පුරුද්දක් නැති නිසාම ඩප්පියාගේ පසු පස්සේ වැටී රණ්ඩුව බේරීමට පිරිස අතර මැදට පැන්නේය.

සයිමා කොල්ලෝ දෙන්නෙක් ඇදගෙන ඇවිත් බංකුවක් උඩ ඉන්දුවේය. ඩප්පියා ද කොල්ලෙක්ව අමාරුවෙන් කුදලාගෙන බංකුවට අසලට ආවත් එතැනත් ගැටුමකට සෙට් වුණේය.

"අඩෝ උඹලව ඉතුරු කරන්නේ නෑ හරිද අපි මේකේ බලේ ගන්වා කෝම හරි දැන් රැල්ල අපිට හැදිල තියෙන්නේ බලපං දෙනවා පැණි බේරෙන්න" යැයි සයිමා අසල උන් එකෙක් ඩප්පියා කුදලාගෙන ආ එකාට තර්ජනය කළේය.

"හා... හා... මල්ලිලා දැන් ෂේප්, කරගන්න මගුලක් පස්සේ, ගුටි ඇණගෙන දිනාගන්න පුලුවන් මගුලක් නෑ, මෙච්චර කල් එහෙම වුනෙත් නෑ" සයිමා කියාගෙන ගියේය.

"නෑ අයියේ මුන් මේ පොඩි හුච්චං පක්ෂයකට සෙට් වෙලා, මේකේ දෙයක් කරන්න පුළුවන් උන් එකක සෙට් වෙන්න එපැයි" කොල්ලා කියාගෙන යද්දී සයිමා කොල්ලාව බැලන්ස් කළේය.

"හරි දැන් ෂේප්... දැන් කියමු බලන්න මොකද්ද ඔය හුච්චං කතාව"

"මේකයි අයියේ මුන් පෙරෙට්ටන්ට කඩේ යනවා. අපිත් සෙට් වෙනවා උද්ඝෝෂණ වැඩවලට, හැබැයි එළියේ අනිත් හැම මගුලක්ම කරන්නේ අපේ පක්ෂයේ අය. බලය තියෙන්නේ අපිට. මුන් මේක බලෙන් අල්ලගෙන ඉන්නවා"

"දැන් මොකද්ද මල්ලිගේ පක්ෂය ඔය කියන"

"අපි මාලිමා අයියේ..."

සයිමාට වැඩේ මීටර් විය. දැන් මේ වැඩේ යන්නේ එහෙමය. ඉදිරියේදී මහා ව්‍යසනයක් ඇතිවීමේ අවධානමක් ඇති වන බව සයිමාට සිතුනි.

"මේකයි මල්ලිලා, පක්ෂවල බලය බේරන්න උඹලා ගුටි බැට හුවමාරු කරගෙන ලේ පෙරාගෙන හරි යන්නේ නෑ. ඒවා උන් වෙන විදිවලට බේරග න්නවා. ඒවා උඹලා මේ ඉගෙන ගන්න ඇවිත් ජීවිත නැති කරගෙන, බලය අත්පත් කරගන්න ඕන දේවල් නෙවෙයි. මමත් මේ මගුලවල කප්පරක් සෙල්ලම් දාපු එකෙක්. ඒත් මල්ලී දැන් තේරෙනවා. බලය කාට ගියත් අපිට අපිමයි අන්තිමට ඉතිරි වෙන්නේ. ඒ නිසා මේවා තව එකෙකුට ගහල බලේ ගන්නවා කියන වැඩ හෙන ම්ලේච්ඡ වැඩ. ඒවාට උඩ ගෙඩි දෙනවා පක්ෂ. උන් ඉන්නෙත් තවමත් ගල් යුගයේ. තේරුම් ගනින් මල්ලිලා. හරි දැන් ෂේප් වැඩේ. අපි ගියා එහෙනම්" යැයි කියමින් ඩප්පියා සමග සයිමා එළියට ආවේය.

තව්තිසා

# Get ready for slow economic recovery amidst LG polls




Everyone seems to be in a bit of a debt bind and confused mind set on voting at the upcoming local government elections which is to cost Rs. 10 billion of tax payers' money from 2023 budgetary allocation at the moment.

The government has run out of cash as the monthly revenue is not sufficient to meet the expenditure.

Making financial matters worse, opposition political parties with left wing Marxist ideology and right wing social market economy - a fusion of economic liberalism, are hell bent on demanding the government to hold local polls to protect their so called democracy irrespective of the financial hard ships faced by the country in the manmade economic crisis.

These two parties along with groups of extremists are threatening to stage street fights if the government postpones the election citing current cash flow issues of the Treasury.

The total revenue for January alone is only Rs. 158.07 billion while a sum of Rs. 367.08 billion has been spent as government expenditure which includes Rs.87.42 billion for public sector salary, Rs.29.59 billion for Pension and Samurdhi and Rs.10.88 billion for other expenses along with loan instalments.

This was the true financial situation of the country at present, according to finance ministry statistics and therefore everyone can understand the gravity of the cash flow issue of the Treasury by looking at these simple revenue and expenditure data.

How can the Treasury give money to the Election Commission headed by Nimal Punchihewa as and when he sends a note to the finance ministry secretary asking money for election expenditure?

He has requested Rs. 800 million from the Treasury as election expenditure for February alone at a time where the Commissioner General of Elections Saman Sri Ratnayake has submitted an election cost estimate under 14 expenditure headings amounting Rs. 9.1 billion.

However, Mr. Punchihewa had stated that the Election Commission will make all efforts possible to restrict the cost of conducting the Local Government polls under Rs. 8 billion and not to exceed Rs. 10 billion or more as suggested by certain political parties and groups. Now he has to go back on his statement as Commissioner General of Elections has submitted an actual estimate as Rs. 9.1 billion.

The actual expenses will go above the limit of Rs. 10 billion as some of the cost estimates including the expenditure for the Police Department have not been finalized as yet.

The Government Printing Department has only received only Rs. 400 million from the Treasury but the total cost of printings related to the LG polls has already surpassed Rs. 700 million.

On Monday, Chief Printer Gangani Liyanage said printing of ballot papers will cost Rs. 234.6 million and together with printing other election-related documents the total cost would be Rs. 401 million.

The Chief Printer categorically stated that she is pressurized from the Election Commission and the Treasury with no cash in hand to continue ballot paper printing and no one is willing to supply necessary printing material on credit basis.

She announced that ballot papers for the Local Government election have been printed for seven districts and she is now compelled to stop work as workers cannot work without additional payments for overtime during this difficult period.

It is unfortunate, indeed tragic, that these negative developments undermine the very positive stances that President Ranil Wickremesinghe has been taking on other issues including the implementation of electricity tariff formula and tax hike to raise the revenue as well as winning the confidence of the International Monetary Fund with regard to debt sustainability.



**Meanwhile, the Ceylon Electricity Board hiked consumer rates by up to 275 percent, the second steep increase in months as the bankrupt island nation works to secure an IMF bailout. The tug of war between Chairman of the Public Utilities Commission of Sri Lanka (PUCSL) Chairman Janaka Ratnayake and Energy Ministry along with the Ceylon Electricity Board ended in a check mate for the PUCSL head as three new members of the commission had given approval for tariff hike.**

President Wickremesinghe is also effectively handling the ethnic and religious minorities issue regarding their place in the country.

The most notable of these is his assertion that a political solution needs to be found to ensure that reconciliation between the ethnic and religious communities becomes a sustainable reality.

He has articulated his position clearly and without ambiguity on the matter of the 13th Amendment with an understanding and level of courage that no other present day political leader has been prepared to do so.

Meanwhile, the Ceylon Electricity Board hiked consumer rates by up to 275 percent, the second steep increase in months as the bankrupt island nation works to secure an IMF bailout.

The tug of war between Chairman of the Public Utilities Commission of Sri Lanka (PUCSL) Chairman Janaka Ratnayake and Energy Ministry along with the Ceylon Electricity Board ended in a check mate for the PUCSL head as three new members of the commission had given approval for tariff hike.

"We had to raise electricity charges to be in line with IMF conditions that we cannot get handouts from the Treasury," Energy Minister Kanchana Wijesekera said, adding that "we need to generate revenues to cover our costs."

The rate hikes would allow also Sri Lanka's state electricity monopoly to end the 140-minute daily blackouts currently in force around the island.

With increased revenue, CEB will be able to buy the fuel necessary to ensure uninterrupted power from Thursday (16). However, the people will have to bear the increased electricity charges due to present economic crisis which has to be settled.

Viewing from the national point of view, the new tax increases should be supported since everyone has to protect the State first. The people come next and we can forget about the interests of the government.

This is not the time to bring popular politics by the opposition parties and claim that "when we will be in power, we will reduce the taxes and introduce economic policies to bring prosperity to the country", which has led Sri Lanka to the present disastrous situation.

**Carcharodon**

# களையிழந்து போன குட்டித் தேர்தல்!
# ஜனநாயகம் எங்கே?

மார்ச் 9 ஆம் திகதி குட்டித் தேர்தலுக்கான திகதி அறிவிக்கப்பட்டுள்ளது. இதற்கான பிரச்சாரங்களில் இரண்டு எதிர்க்கட்சிகள் மட்டும் மும்முரமாக ஈடுபட்டுள்ளன. ஆனால் வழமையான தேர்தல் களையை இந்தக் குட்டித் தேர்தல் இழந்துள்ளது. வேட்பாளர்கள் பிரச்சாரங்களுக்கு செலவிடுவதா, இல்லையா என்ற குழப்பத்தில் உள்ளனர். குறிப்பாக இந்தக் குட்டித் தேர்தல் நடக்காது என்று ஒரு தரப்புக் கூறினாலும், எப்படியாவது தேர்தலைப் பெறுவோம் என்று கங்கணம் கட்டிக்கொண்டு எதிர்க்கட்சிகள் பிரசாரங்களை ஆரம்பித்துள்ளன.




## தபால்மூல வாக்கெடுப்பு

யானை வரும் பின்னே, மணியோசை வரும் முன்னே என்ற பழமொழிக்கமைய சில சுற்றுநிருபங்கள் அண்மைக்காலத்தில் வெளிவந்திருந்தன. இதில் முக்கியமாக அரச நிறுவனங்கள் இனிமேல் கடனுக்கு சேவையைப் பெறவோ, வழங்கவோ கூடாது என்ற சுற்றுநிருபம் முக்கியமானது. அவ்வாறு கடனடிப்படையில் சேவைகளையோ, பொருட்களையோ பெறும் பட்சத்தில் அதற்கான பொறுப்பை குறித்த தலைவர் தனிப்பட்ட ரீதியில் ஏற்க வேண்டும் என்றும் அந்த சுற்றுநிருபத்தில் குறிப்பிடப்பட்டுள்ளது. இந்த சுற்றுநிருபம்தான் தற்போது அரச அச்சகத் திணைக்களத் தலைவருக்கு நெருக்கடிகளை ஏற்படுத்தியுள்ளது. திறைசேரி பணத்தை வழங்காமல், தபால்மூல வாக்குச்சீட்டுக்களை அச்சிட முடியாத நிலையில் இருப்பதாக அச்சகத் தலைவர் அறிவித்துள்ளார். இதனால் அரசியலமைப்பிற்கு முரணாக அச்சகத் திணைக்களத் தலைவர் செயல்படுகிறார், அவருக்கெதிராக சட்ட நடவடிக்கை எடுக்கப்படும் என்று எதிர்க்கட்சிகள் கூச்சலிடுகின்றன. ஆனால், இறுதியாக வெளியிடப்பட்ட சுற்று நிருபத்தின்படி செயல்படுவதாக அச்சகத் திணைக்களத் தலைவர் கூறுகிறார். இந்த இழுபறி தேர்தலை குறித்த திகதியில் நடத்த முடியாமல் தேர்தல் ஆணைக்குழுவை நெருக்கடிக்குள்ளாக்கும் என்று தெரிகிறது. இதனைத்தவிர, பொலிஸ் திணைக்களமும் பொலிசாரை கடமைகளில் ஈடுபடுத்தாமல் இழுத்தடித்து வருகிறது.

## தேர்தல் செலவு

தேர்தலுக்கு சுமார் 10 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. ஆனால் இந்தத் தேர்தலை 8 பில்லியன் ரூபாவில் நடத்தி முடிக்கலாம் என்று மதிப்பிடப்பட்டுள்ளது. குறித்த 8 பில்லியன் ரூபாயும் உடனடியாகத் தேவையில்லை, கொடுப்பனவுகளை பிற்கொடுப்பனவுகளாக செலுத்தலாம் என்ற நடைமுறையே முன்னர் இருந்தது. எனினும், கொடுப்பனவு குறித்து புதிதாக வந்த சுற்றுநிருபத்தின்படி கடன் அடிப்படையில் சேவைகளைப் பெறுவதற்கு தடங்கல் ஏற்பட்டுள்ளது. எவ்வாறாயினும், குறைந்தபட்சம் இரண்டு பில்லியன் ரூபாயை திறைசேரி வழங்கினால் மட்டுமே தேர்தலுக்கான ஆயத்தப் பணிகளை தேர்தல் ஆணைக்குழுவினால் முன்னெடுக்க முடியும் என்பதே தேர்தல் ஆணைக்குழு அதிகாரிகளின் கருத்தாக இருக்கிறது. திறைசேரியில் இருந்து பணத்தைப் பெறும் முயற்சியில் தேர்தல் ஆணைக்குழுத் தலைவர் தொடர் பேச்சுக்களை நடத்தி வருகிறார்.

## தேர்தலுக்கான சட்ட ஏற்பாடு

குட்டித் தேர்தலுக்கு இத்தனை தடைகள் இருக்கும் சமயத்தில், தேர்தலைத் தடையின்றி நடத்த உத்தரவிட வேண்டும் என்று பிரதான எதிர்க்கட்சி நீதிமன்றத்தில் வழக்கொன்றையும் தாக்கல் செய்துள்ளது. இந்த வழக்கும் வரும் 23ஆம் திகதியே விசாரிக்கப்படவுள்ளது. இந்த நிலைமைகளைப் பார்க்கும்போது குறித்த திகதியில் அதாவது மார்ச் 9ஆம் திகதி தேர்தலை நடத்துவதற்கான எந்தவொரு முகாந்திரமும் இல்லையென்றே தெரிகிறது. இந்த இழுபறி நிலையால் வேட்பாளர்கள் தமது பிரச்சாரங்களை முன்னெடுப்பதா, இல்லையா என்ற குழப்பத்தில் உள்ளனர். ஆனால் தேர்தலைப் பெற்றே தீருவோம் என்று ஜே.வி.பி தலைமையிலான தேசிய மக்கள் சக்தி தீவிர பிரசாரத்தை முன்னெடுத்துள்ளது.

## இரு கட்சி தேர்தல் பிரசாரம்

மார்ச் 9ஆம் திகதி தேர்தல் நடத்தும் பட்சத்தில், அநுரகுமார திசாநாயக்க தலைமையிலான தேசிய மக்கள் சக்தி மற்றும் சஜித பிரேமதாச தலைமையிலான ஐக்கிய மக்கள் சக்தி ஆகிய கட்சிகள் அதிக வாக்குகளைப் பெறும் என்ற நம்பிக்கையில் தமது பிரசாரங்களை முன்னெடுத்துள்ளன. இந்தக் குட்டித் தேர்தல் ஆட்சியில் மாற்றத்தை ஏற்படுத்தாத போதிலும், இதனைப் பயன்படுத்தி பொதுத் தேர்தல் ஒன்றைப் பெறும் முயற்சியில் குறித்த கட்சிகள் திட்டம் வகுத்துள்ளன. ஆனால் இந்தக் குட்டித் தேர்தலில் தேசிய மக்கள் சக்தி, சஜித் பிரேமதாச தலைமையிலான ஐக்கிய மக்கள் சக்திக்கு பாரிய சவாலை ஏற்படுத்தியுள்ளது. இதனால், அனைத்துத் தேர்தல் மேடைகளிலும் அநுரகுமார திசாநாயக்க உள்ளிட்ட தேசிய மக்கள் சக்தியை, சஜித் பிரேமதாச பரிகாசம் செய்துவருவதைப் பார்க்கக் கூடியதாக இருக்கிறது. அத்துடன் தேர்தலை அரசாங்கம் பிற்போட முயற்சித்தால் லட்சக்கணக்கான மக்களுடன் வீதிக்கு இறங்குவோம் என்று அநுரகுமார மிரட்டி வருகிறார். ஆனால் மார்ச் 9ஆம் திகதி தேர்தல் ஒன்று நடப்பதற்கான சாத்தியங்கள் மிகக் குறைவாகவே தென்படுகின்றன.

## ரணிலின் திட்டம் என்ன?

ரணில் விக்ரமசிங்க தேர்தலைப் பிற்போடத் திட்டம் தீட்டுகிறார் என்று எதிர்க்கட்சிகள் சாடி வருகின்றன. உண்மையில் ரணிலின் திட்டம் என்ன என்பதை அநேகருக்கு ஊகிக்க முடியாமல் இருக்கிறது. பொருளாரத்தை சீர்செய்ய வேண்டும், நாட்டைக் கட்டியெழுப்ப வேண்டும் என்ற வார்த்தைகளையே ரணில் விக்ரமசிங்க தொடர்ந்து கூறிவருகிறார். இதற்கான நகர்வுகளையும் காணக் கூடியதாக இருக்கிறது. குறிப்பாக மின்சார கட்டணம் அதிகரிப்பு. இதற்கு கடுமையான எதிர்ப்புக்கள் உள்ளன. ஆனால் சர்வதேச நாணய நிதியத்தின் கடுமையான நிபந்தனைகளை நிறைவேற்றவே இந்த மறுசீரமைப்புக்கள் மேற்கொள்ளப்படுவதைப் பார்க்க முடிகிறது. நீங்கள் நட்டத்தில் இயங்குவதற்கு நாம் கடன்வழங்க முடியாது என்பதே சர்வதேச நாணய நிதியத்தின் கடுமையான நிபந்தனையாகும். சுமார் 14,000 ஊழியர்களுடன் மின்சார சபை இயங்கி வருகிறது. இந்தத் துறை மறுசீரமைக்கப்பட வேண்டும் என்று ரணில் விக்ரமசிங்க திட்டமிட்டுள்ளார். இதற்கு கடுமையான எதிர்ப்புக்கள் உள்ளன. மின்சார சபையை மறுசீரமைக்க இடமளிக்காத பட்சத்தில், அதனை தனியார்மயப்படுத்துவதற்கு ரணில் விக்ரமசிங்க முயற்சிகளை எடுத்தாலும் ஆச்சரியப்படுவதற்கில்லை. அதேபோல, ஸ்ரீலங்கா எயார்லைன்ஸ் நிறுவனமும் பாரிய நட்டத்தில் இயங்கி வருகிறது. இதற்கான நட்டத்தை ஈடுசெய்யவும் மக்களின் வரிப்பணமே பயன்படுத்தப்படுகிறது. இவ்வாறு எவ்வளவு பணம் சேகரித்தாலும் பாரிய ஓட்டைகளின் ஊடாக பொதுமக்களின் பல பில்லியன் ரூபாய் வீண்விரயமாகிறது. இவற்றைத் தடுப்பதில் ரணில் விக்ரமசிங்க முழு மூச்சில் ஈடுபட்டுள்ளார் என்றே தெரிகிறது. இந்தப் போராட்டத்திற்கு மத்தியில்தான் எதிர்க்கட்சிகள் குட்டித் தேர்தலுக்காக கங்கணம் கட்டி வீதிகளில் இறங்கத் திட்டமிட்டு வருகின்றன.

இந்த நெருக்கடியான நேரத்தில் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப மறுசீரமைப்புக்கள் அத்தியாவசியமானவை. இந்தச் சந்தர்ப்பத்தைத் தவறவிட்டால், இனி எப்போதும் இந்த நட்டத்தில் இயங்கும் நிறுவனங்களை மறுசீரமைக்க முடியாமல் போகும். இன்னும் எத்தனை வருடங்கள் நடந்தாலும், இலங்கையால் இந்த நெருக்கடியில் இருந்தும், கடன் பொறியில் இருந்தும் விடுபட முடியாமல் போகும். இந்த மறுசீரமைப்புக்களுக்கு முன்னர் குட்டித் தேர்தல் நடந்தாலும், பிரதேச சபைகளுக்கு ஒதுக்குவதற்கு திறைசேரியில் பணம் இருக்காது. வெறுமனே 8,000 உறுப்பினர்களுக்கு சம்பளம் கொடுக்கும் சுமையும் அதிகரிக்கும். எனவே, அத்தியாவசியமான மறுசீரமைப்புக்கள் செய்யப்பட்டு, சர்வதேச நாணய நிதியத்தின் உதவி பெறப்பட்டு, பொருளாதாரம் ஸ்திரத்தன்மைக்கு வந்தபின்னர் குட்டித் தேர்தல் நடக்குமாயின், பிரதேச சபை உறுப்பினர்களுக்கும் மக்களின் தேவைகளைப் பூர்த்தி செய்யக்கூடியதாக இருக்கும். அரசியல் கட்சிகளின் தேவைக்கேற்ப தேர்தலை நடத்தாது, மக்களின் தேவை கருதியே தேர்தல் நடத்தப்பட வேண்டும். அப்போதுதான் தேர்தல் களைகட்டும், ஜனநாயகம் தழைத்திருக்கும்.

வீ.ஏ.கே.







අහංගම, කතළුව, මැදගොඩ, ගිණිවැල්ල පාර, අංක 72 දරණ ස්ථානයේ පදිංචි ජී.එස්. උදයංග වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී